

2021

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

SLF
ශ්‍රී ලංකා පදනම
இலங்கை மன்றம்
Sri Lanka Foundation

ශ්‍රී ලංකා පදනම
இலங்கை மன்றம்
SRI LANKA FOUNDATION

අන්තර්ගතය

- හැඳින්වීම 1
- පුහුණුව හා අධ්‍යාපනය SLFI ආයතනයක 2
- අධ්‍යයන අංශවල කාර්ය සාධනය 3
- මානව සම්පත් සංවර්ධන කළමනාකරණ පීඨය 3
    - ඩිප්ලෝමා පාඨමාලා 3
    - සහතිකපත් පාඨමාලා 4
- මනෝවිද්‍යා හා උපදේශන පීඨය 4
    - ඩිප්ලෝමා පාඨමාලා 4
    - සහතිකපත් පාඨමාලා 5
- මානව ශාත්‍ර හා සමාජ විද්‍යා පීඨය 5
    - චිත්‍රපට හා රූපවාහිනී 5
    - භාෂා අධ්‍යාපනය 6
- විවෘත හා දුරස්ථ ඉගෙනුම් පීඨය 6
    - ඩිප්ලෝමා පාඨමාලා 6
    - සහතිකපත් පාඨමාලා 6
- උපාධි අධ්‍යයන පීඨය 7
- විදේශ පුහුණු සහයෝගිතා 7
    - විදේශ පුහුණු සහයෝගීතාව 7
    - දේශීය පුහුණු සහයෝගීතාව 7
- සිසුන් පාදක කර ගනිමින් නිර්මාණය කරන ලද වැඩසටහන් 8
- වාර්ෂික ඩිප්ලෝමා සහතිකපත් ප්‍රධානය කිරීමේ උත්සවය 9
- සහතික පත්‍ර ප්‍රධානෝත්සවය 2021 9
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය 10
- පර්යේෂණය හා ප්‍රකාශන ඒකකය 10
- පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන 10
- හවුල්කාරීත්වය හා විශේෂ උත්සව 11
- රාජ්‍ය තාන්ත්‍රික කාර්ය 11
- ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය සිනමාකරණ -පාඨමාලාව 11
- ආයතනිකව සහයෝගිතාවයෙන් සිදු කළ විවෘත කිරීම් 12

- Q – Shop 12
- කාබනික ආහාර සැපයුම් මධ්‍යස්ථානය 12

- පුහුණු යටිතල පහසුකම් සංවර්ධනය 13
- සම්මන්ත්‍රණ ශාලාව 13
- සේවක සුභසාධනය 13
- අධ්‍යාපන සැලැස්ම 14
  - Ph.D. වැඩසටහන් 2020 14
  - උසස් ජාතික සහ ජාතික ඩිප්ලෝමා පාඨමාලා 15 – 21
  - සහතික පත් පාඨමාලා 2020 21 – 25
  - වැඩමුළුව 2020 26 – 29
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 30
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 31
- මූල්‍ය කාර්ය සාධන පිළිබඳ ප්‍රකාශය 32
- ශුද්ධ වත්කම් පරස්පරතාවය පිළිබඳ ප්‍රකාශය 33
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 34
- මූල්‍ය ප්‍රකාශසටහන් 35 – 48
- විගණකාධිපති වාර්තාව 49 – 56

වාර්ෂික වාර්තාව - 2021

ශ්‍රී ලංකා පදනම් ආයතනය

හැඳින්වීම

ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා පදනම යන සිය ව්‍යාපෘතිය මඟින් සමාජ සංගත බව සහ සමාජ ප්‍රගතිය අරමුණු කරගත් නිශ්චිත විෂය ක්ෂේත්‍ර ගණනාවක් හඳුන්වා දෙමින් වැඩිහිටියන් සඳහා අධ්‍යාපනය ලබා දීමට කැප වූ ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛ පෙළේ අධ්‍යාපන මධ්‍යස්ථානයකි. මෙම ආයතනය, 1973 අංක 31 දරණ ශ්‍රී ලංකා පදනම් නීතිය මඟින් ස්ථාපිත කරනු ලැබූ දින සිට දශක හතරක් මුළුල්ලේ ම මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, සාමය සහ සංහිඳියාව යන විෂය ක්ෂේත්‍ර ක්‍රමානුකූලව, මැනවින් යොදා ගැනීම හේතුවෙන් ක්‍රමයෙන් වර්ධනය වී ඇති අද්විතීය මොඩලයකට සමාන වේ.

අධ්‍යාපනය සහ පුහුණුව මඟින් වර්තමානයේ සමාජයීය, දේශපාලනික, ආර්ථික සහ පාරිසරික සන්දර්භය තුළ රටේ පවත්නා ගැටළු සඳහා විසඳුම් ලබා දීමට මෙන් ම අනාගතයේ උද්ගත විය හැකි ජාතික අවශ්‍යතා සඳහා යෝජනා සහ විසඳුම් ලබා දීමට උපකාරී වන ජාතික මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනය ජාතියට සිය මෙහෙවර සිදු කරයි. සිවිල් අයිතිවාසිකම් සහ නීතියේ පරමාධිපත්‍ය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ගෝලීය සහ ජාතික වටිනාකමකින් යුතු විවිධ අධ්‍යාපනික අවශ්‍යතා සඳහා අවධානය යොමු කිරීම ශ්‍රී ලංකා පදනම් ආයතනයේ මූලික පරමාර්ථය යි.

අපගේ දැක්ම

ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් සහ සමාජ අභිවෘද්ධිය පිළිබඳ දැනුවත් ශ්‍රී ලාංකික සමාජයක්.

අපගේ මෙහෙවර

ප්‍රතිපත්ති උපදේශනය, අධ්‍යාපනය, පුහුණුව මෙන් ම දැනුවත් බව ඇති කරලීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට සහාය වීම.

අපගේ වටිනාකම්

කවර ආකාරයේ හෝ වෙනස්කම්වලින් තොර, අපක්ෂපාති, වගවීමෙන් සහ විනිවිදභාවයෙන් යුතු ඒකාබද්ධ සහ බහුවිධ සමාජයක් අපි අගය කරන්නෙමු.

පුහුණුව සහ අධ්‍යාපනය - ශ්‍රී ලංකා පදනම් ආයතනය

කොවිඩ් -19 වසංගත තත්ත්වය අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයට 2021 වර්ෂය ද අභියෝගාත්මක වර්ෂයක් වූ නමුත් මාර්ගගත වැඩසටහන් රාශියක් සැලසුම් කිරීමේ හා පැවැත්වීමේ හැකියාව ශ්‍රී ලංකා පදනම් ආයතනයට ලැබුණි. ශ්‍රී ලංකා පදනම් ආයතනය ඉටු කරනු ලබන කර්තව්‍යයන් මන්දගාමී ව ක්‍රියාත්මක වුවත්, එය ස්ථීරසාර ලෙස වර්ධනය වීම අප ආයතනය විසින් පිරිනමනු ලබන සේවාවන් අඛණ්ඩව ස්ථාවර්තවයට පත් වීමට හේතු වූ අතර, වර්ෂයේ දෙවන භාගයේ දී ආදායම් උත්පාදනය වර්ධනය කිරීමට ද ඉවහල් විය.

ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන කර්තව්‍යය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ සහාය නිරන්තරයෙන් ලබා දෙමින් ඒ පිටුපස සිටිනා දැවැන්ත හස්තය යි.

නුදුරු අනාගතයේ සිට විශ්වවිද්‍යාලයක් වශයෙන් කටයුතු කිරීම සඳහා කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිවීම ශ්‍රී ලංකා පදනම් ආයතනය මෙම වර්ෂය තුළ දී ලබා ගත් අතිවිශිෂ්ඨ ජයග්‍රහණයකි.

2021 වර්ෂයේ අගභාගය වන විට, වැඩමුළු සහ අනෙකුත් කෙටි කාලීන පාඨමාලා සඳහා වැඩි සිසුන් පිරිසකට සහභාගි වීමට හැකිවන පරිදි ඇතැම් පාඨමාලා සඳහා පන්ති කාමර සැසි පැවැත්වීමේ හැකියාව ශ්‍රී ලංකා පදනම් ආයතනයට ලැබුණි.

වසංගත තත්ත්වය හේතුවෙන් පෙර නොවූ අන්දමේ අභියෝග රැසකට මුහුණ දීමට සිදු වූ නමුත්, අධ්‍යාපනික සහ ආයතනික සංවර්ධනය වෙනුවෙන් මෙම වර්ෂය කැප කෙරුණි. පෙර වසරේ සිදු වූ පසුබෑම් ද සමඟින් වාර්ෂික පුහුණු දින දර්ශනයට අනුව බොහෝ නව පාඨමාලා ආරම්භ කිරීමට ද හැකි විය.

ශ්‍රී ලංකා පදනම් ආයතනය සිය පුහුණු සහ කාර්යාල කටයුතුවලදී කඩදාසි භාවිතයට නොගෙන හෝ භාවිතය අවම කරමින් සහ විදුලිය භාවිතය සඳහා සීමා පනවමින් පොදු කාර්ය සඳහා වැය වන වියදම් කපා හැරීමට විශේෂ පියවර අනුගමනය කරන ලදී.

පුහුණු කාර්ය සාධනය 2020

ආචාර්ය උපාධි වැඩසටහන්	03	
උපාධි වැඩසටහන්	02	
උසස් ජාතික ඩිප්ලෝමා	17	2020 සහ 2021
ජාතික ඩිප්ලෝමා	27	
උසස් සහතිකපත්‍ර සහ සහතිකපත්‍ර පාඨමාලා	45	2020 සහ 2021
වැඩමුළු	33	
කාර්යක්ෂමතා කඩඉම් විභාග	07	
සහයෝගිතා වැඩසටහන් - දේශීය	11	

❖ 2021 දී පවත්වන ලද සම්පූර්ණ වැඩසටහන් ලැයිස්තුව අමුණා ඇත.

පුහුණු කාර්ය සාධනය- ශ්‍රීලපඅා 2021



අධ්‍යයන අංශවල කාර්ය සාධනය

අධ්‍යයන අංශවල කාර්ය සාධනය

මානව සම්පත් සංවර්ධන සහ කළමනාකරණ පීඨය



මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනය මෙම වර්ෂය ආරම්භයේ සිට වැඩි දියුණු වූ අතර පාඨමාලා ගණනාවක් ම මෙම විෂය ක්ෂේත්‍රය යටතේ පවත්වන ලදී. රාජ්‍ය අංශයේ නිළධාරීන් බොහෝ පිරිසක් මෙම වැඩසටහන් සඳහා සහභාගි විය.



කොවිඩ් දෙවන රැල්ලෙන් පසුව ක්‍රීඩා වැඩසටහන් ද ආරම්භ වීම සිදු විය. පුහුණු වැඩසටහන්වලට අමතරව, ව්‍යාපාර පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දී කුඩා පරිමාණයේ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද පීඨයේ අවධානය යොමු කරන ලදී.

ඩිප්ලෝමා පාඨමාලා

මානව සම්පත් කළමණාකරණය සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව.
ක්‍රීඩා ශක්තිය සහ සමීකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව -2020 සහ 2021 කාණ්ඩ
මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (Matrix)
මානව සම්පත් හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව අනුකෘති අනුවාදය
ව්‍යාපාර පරිපාලනය සහ මානව සම්පත් පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

සහතික පාඨමාලා

මානව සම්පත් කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (කාණ්ඩ 3 ක්)
ව්‍යාපාර පරිපාලනය සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
මානව සම්පත් කළමණාකරණය සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
(Sports Masseurs) සහ (Physical Therapy Assistants) සඳහා සහතික පත්‍ර පාඨමාලාව (කාණ්ඩ 3 ක්)
යෝග්‍යතා පුහුණුකරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව (කාණ්ඩ 2ක්)
කොටස් වෙළඳපොළ ආයෝජනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සම්බන්ධීකරණය පුස්තකාලයාධිපති ගයනි විතානගේ මහත්මිය විසිනි)

මනෝ විද්‍යා සහ උපදේශන පීඨය





විවිධ අධ්‍යයන ක්ෂේත්‍රයන්ට ගැළපෙන අයුරින් උපදේශනය සම්බන්ධයෙන් වෙනස් ආකාරයේ වැඩසටහන් රාශියක් සංවිධානය කිරීමට හැකි වන පරිදි මනෝවිද්‍යා හා උපදේශන වැඩසටහන් සඳහා සුපුරුදු යහපත් ප්‍රතිචාර ලැබුණි. ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ ද උපාධි පාඨමාලා දක්වා වූ උසස් ජාතික ඩිප්ලෝමා පැවැත්වීම සඳහා ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ ද මෙම පීඨය ඒකාබද්ධ වීම සිදු විය. වර්ෂය තුළ දී මාර්ගගතව මෙන් ම භෞතික වශයෙන් ද පන්ති පැවැත්වුණි.

ඩිප්ලෝමා පාඨමාලා

උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (සෙනසුරාදා)
මනෝ චිකිත්සාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2020 (ඉරිදා)
පවුල් උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2020 මාර්ගගතව
උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව - (ඉරිදා)
මනෝවිද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ)-කාණ්ඩ 2 ක්
මනෝ චිකිත්සාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - කණ්ඩායම් 2 යි.
මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ)
ජාතික උපදේශන ඩිප්ලෝමාව - ද්විභාෂා
ජාතික උපදේශන ඩිප්ලෝමාව - ඉංග්‍රීසි
නාට්‍ය චිකිත්සාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාව
කාන්තා පොලිස් නිළධාරිනියන් සඳහා මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - මාර්ගගතව
ජාතික උපදේශන ඩිප්ලෝමාව (ඉංග්‍රීසි)
ජාතික උපදේශන ඩිප්ලෝමාව (සිංහල)

සහතික පාඨමාලා
මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - කාණ්ඩ 2 ක්
ළමා මනෝවිද්‍යාව සහ ළමා ආරක්ෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගතව) - G3/2021
ඔනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
උපදේශනය සඳහා යෝගා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සෙනසුරාදා - කාණ්ඩ 2ක්)

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය





භාෂා අධ්‍යයනය, සිනමා සහ රූපවාහිනී අධ්‍යයනය මෙන් ම සමාජ විද්‍යා යන අධ්‍යයන අංශ කිහිපයෙන් මෙම පීඨය සමන්විත ය. භාෂාව පදනම් වූ මාර්ගගත වැඩසටහන් මෙම වර්ෂයේ දී හඳුන්වා දුන් විශේෂ වැඩසටහන් වේ.

2021 වර්ෂයේ මැද භාගයේ සිට සිනමා සහ රූපවාහිනී අධ්‍යයනයට අදාළ ප්‍රායෝගික සැසිවාර නැවත ආරම්භ විය.

සිනමා සහ රූපවාහිනිය

ඩිප්ලෝමා පාඨමාලා
චිත්‍රපට නිෂ්පාදනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
නර්තන ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

සහතික පාඨමාලා
ප්‍රවෘත්ති කියවීමේ සහතික පත්‍ර පාඨමාලාව
කැමරා වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ද්විභාෂා)
රේඛීය නොවන වීඩියෝ සංස්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ඩිප්ලෝමා පාඨමාලා
දෘෂ්ටි විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
දේශපාලන සහ රාජ්‍ය කළමණාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
ව්‍යවහාරික අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
අපරාධ නීතිය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
ජ්‍යෝතිශ ශාස්ත්‍රය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
වයස්ගත සත්කාර පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (මාර්ගගත)
වයස්ගත රැකවරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජර්මානු වීසා)
චෙස් පුහුණු කිරීමේ ජාතික ඩිප්ලෝමාව

සහතික පාඨමාලා

ජ්‍යෝතිශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
ව්‍යවහාරික අපරාධ විද්‍යාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)
වෘත්තීය සංවර්ධනය පිළිබඳ උසස් සහතිකය (මාර්ගගත)
දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
වෘත්තීය ජනමාධ්‍යවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
සමාජ සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)
මිනුම් ඒකකයේ ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සඳහා නීති පුහුණුව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (NYSC)
අභ්‍යන්තර නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
මිනුම් උපකරණ සහ සේවා පරීක්ෂකවරුන් සඳහා නීති පුහුණුව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.

භාෂා අධ්‍යයනය

ඉංග්‍රීසි වෘත්තීය සංවර්ධනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
අධ්‍යාපනයේ උසස් ජාතික ඩිප්ලෝමාව (දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම - ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ)
''දිවුරුම් දුන් පරිවර්තකයන් සඳහා පරිවර්තන'' හි උසස් සහතික පත්‍ර පාඨමාලාව
ඉංග්‍රීසි කථනය පිළිබඳ සහතිකය - මාර්ගගත (1 කොටස)
ලිවීමේ කුසලතා (විධායක නොවන) ශ්‍රී ලංකා බලශක්ති සහතික පත්‍ර පාඨමාලාව - (මාර්ගගත)
ඉංග්‍රීසි කථනය (මාර්ගගත) පිළිබඳ සහතිකය (2 කොටස)
පරිවර්තනය සහ අර්ථ නිරූපණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දෙමළ සහ ඉංග්‍රීසි) - (මාර්ගගත)
චීන භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (මාර්ගගත)
කොරියානු භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (මාර්ගගත)
ජපන් භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (මාර්ගගත)
හින්දි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (මාර්ගගත)
ඉංග්‍රීසි කථනය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - STF නිලධාරීන්

විවෘත සහ දුරස්ථ අධ්‍යයන පීඨය

විවෘත සහ දුරස්ථ අධ්‍යයන පීඨය මඟින් ක්ෂේත්‍ර දෙකක් ආවරණය කරනු ලබයි. ඒ අනුව, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම මෙන් ම SLF E–Gate දුරස්ථ අධ්‍යාපන මෘදුකාංගය භාවිතයෙන් දුරස්ථ අධ්‍යාපනය ලබා ගැනීමට කැමැත්තක් දක්වන පිරිස සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් පිරිනමනු ලබන අතර ම, ඩිජිටල් පරිවර්තන ඒකකය මඟින් විවිධ සංවිධාන සහ කණ්ඩායම්වලට ඔවුන්ගේ දෛනික තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සපුරාලීමට මයික්‍රොසොෆ්ට් 365 යොදා ගනිමින් E - ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණ සේවා සහ විසඳුම් ලබා දීම සිදු කරයි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ගෝලීය තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුකූල වෙමින් රටේ පවත්නා තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවය සඳහා ඌණ පූරණයක් ලබා දීම ය. මෙම වර්ෂය තුළ දී පිරිනමන ලද පාඨමාලා පහත පරිදි වේ.

ඩිප්ලෝමා පාඨමාලා

තොරතුරු තාක්ෂණය සහ රාජ්‍ය අංශය කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

සහතික පාඨමාලා

පරිගණක යෙදුම් සහකාර සඳහා සහතික පත්‍ර පාඨමාලාව (මට්ටම් 3)
ICT කාර්මික ශිල්පීන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව (4 වන මට්ටම)
පරිගණක යෙදුම් සහකාර (3 වන මට්ටම)
පරිගණක යෙදුම් සහකාර සඳහා සහතිකය (මට්ටම 3)

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

උපාධිය දක්වා වූ උසස් අධ්‍යාපන වැඩසටහන් පිරිනැමීම සඳහා රට පුරා ව්‍යාප්තව ඇති අධ්‍යාපන ආයතන 20ක් සමඟ නව සහයෝගීතාවන්ට එළඹෙන ලදී. 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද ආචාර්ය උපාධිවලට අමතරව නව උපාධි වැඩසටහන් දෙකක් මෙම වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී.

පුහුණු සහයෝගීතා

විදේශ පුහුණු සහයෝගීතා

ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ප්‍රථම අධ්‍යාපන සංචාරක වැඩසටහන බංගලාදේශ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත තීරකයන් සඳහා සෞඛ්‍ය අංශයේ ප්‍රසම්පාදනය, ගබඩා කිරීම සහ සැපයුම් කළමනාකරණය සම්බන්ධයෙන් සංවිධානය කරන ලදී. අමාත්‍යාංශයේවෛද්‍ය සැපයුම්දාම ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යොදා ගන්නා ලද ඵලදායී ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හුවමාරු කර ගැනීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙම සමාරම්භක උත්සව අවස්ථාව, චම්පිකා අමරසේකර මිය (ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති සහ අධ්‍යක්ෂ (අධ්‍යයන) / අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) ආචාර්ය ආර්. එම්. විජේරත්න සහ දේශීය නියෝජිතයන්ගේ ගෞරවනීය සහභාගීත්වයෙන් 2021 දෙසැම්බර් 21 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුණි.



සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය සහ පවුල් සුභසාධක අමාත්‍යාංශයේ ඒකාබද්ධ ලේකම්, රොකේයා බේගම් මිය, ඩකාහි මධ්‍යම වෛද්‍ය ගබඩා ඩිපෝවේ (Central Medical Stores Depot) නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය තවුහීඩ් අහමද් සහ එම කණ්ඩායම විසින් බංගලාදේශ ධුර මණ්ඩලයේ ප්‍රධානත්වය උසුලන ලදී. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ජ්‍යෙෂ්ඨ කර්මිකාචාර්ය භාරත හේරත් මහතා විසින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලැබීය.



දේශීය පුහුණු සහයෝගීතා

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා බතික් සහ අත්යන්ත්‍ර රෙදි ගම්මාන ව්‍යාපෘතිය.

දිවයින පුරා විසිරී සිටින රෙදිපිළි කර්මාන්තයේ නිරත ව්‍යවසායකයන් සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟළුම් නිෂ්පාදන පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව සංවිධානය කරන ලද වැඩමුළුමාලාවේ සමාරම්භක උත්සවය 2021 මාර්තු 13 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුණි.





බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟළුම් නිෂ්පාදන පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමා, අමාත්‍යාංශ ලේකම් ජානක ධර්මකීර්ති මහතා, අතිරේක ලේකම් නිමල්කා ඩයස් මිය, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති වම්පිකා අමරසේකර මිය, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සභාපති අජිත් ජයවර්ධන මහතා, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂ (අධ්‍යයන) ආචාර්ය ආර්.එම්. විජේරත්න මහතා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ වසන්ත සේනානායක මහතා සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ නිලධාරිහු මෙම අවස්ථාවට සහභාගී විය.

සිසුන් පාදක කර ගනිමින් නිර්මාණය කරන ලද වැඩසටහන්

පහත සඳහන් වැඩසටහන් සහයෝගීතාව මත පදනම්ව පාරිභෝගිකයාගේ රුචියට අනුව නිර්මාණය කරන ලද පුහුණු වැඩසටහන් වේ.

- ඉංග්‍රීසි කථනය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - STF නිලධාරීන් සඳහා
- දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- NYSC සඳහා වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිසම්පාදන, ගබඩා කිරීම සහ සැපයුම් කළමණාකරණය පිළිබඳ බංගලාදේශ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපාය මාර්ගික තීරණගන්නන් සඳහා වන අධ්‍යාපන - සංචාරක වැඩසටහන
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිළධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීම සහ කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ දින 5ක වැඩමුළුව 2021 අප්‍රේල් 5 වන දින සිට 9 වන දින දක්වා පවත්වන ලදී.
- 2021 ජනවාරි 21 වන දින NAIT සඳහා මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන
- ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් බතික්, අත්යන්ත්‍ර සහ දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව දිවයින පුරා පිහිටි රෙදිපිළි ව්‍යවසායකයින් සඳහා සංවිධානය කරන ලද බතික් සහ බතික් ගම්මානය ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළු මාලාවක් 2021 මාර්තු 13 වන දින සිට ශ්‍රී ලංකා පදනම් ආයතනය පරිශ්‍රයේ දී පැවැත්විණි.
- කාන්තා පොලිස් නිළධාරිනියන් සඳහා මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - (මාර්ගගත)
- ඉස්ලාම් සහ අරාබි අධ්‍යයනය සඳහා මහදුස් සල්ම් සඳහා මාර්ගගත ඉගැන්වීම් ක්‍රම පිළිබඳ වැඩමුළුව

වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2021 දෙසැම්බර් 21 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රධාන ශ්‍රවනාගාරයේ දී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණි. පසුගිය වසරේ දී සාර්ථකව ඩිප්ලෝමා හැදෑරූ සිසු සිසුවියන් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය වෙනුවෙන් මෙම උත්සවය සංවිධානය කර තිබුණි. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් නීතිඥ ආචාර්ය අසංග ගුණවර්ධන මහතා උත්සවයට සහභාගි විය.





සමාජ විද්‍යාව, මානව සම්පත් කළමණාකරණය සහ ව්‍යාපාර කළමණාකරණය, මනෝවිද්‍යාව සහ උපදේශනය, සහ රූපවාහිනී සහ සිනමා යන විෂයන්ට අදාළව ශාස්ත්‍රීය විෂයන් දහසයක් නියෝජනය කරමින් සිසු සිසුවියන් 327 දෙනෙකු සඳහා උපාධි පිරිනමන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් කුසලතා දක්වන ලද සිසු සිසුවියන් පස් දෙනෙකු සඳහා ලෝකඩ පදක්කම් පිරිනැමීම සිදු විය. මෙම උත්සවය රෙජිස්ට්‍රාර් ඒකකය විසින් සංවිධානය කරන ලදී.

සහතික පත්‍ර ප්‍රදානෝත්සවය - 2021





ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය - 2021 සිසු සිසුවියන්, සම්පත් දායකයන් සහ දෙමාපියන් රැසකගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රධාන ශ්‍රවනාගාරයේ දී 2021 මාර්තු 30 වන දින පැවැත්වුණි. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා සහ ප්‍රධාන දේශකයා වශයෙන් මෙම උත්සවයට සහභාගි විය. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති ජ්‍යෝෂ්ඨ නීතීඥ චම්පිකා අමරසේකර මහත්මිය විසින් පිළිගැනීමේ කතාව සිදු කරමින් උත්සවයට පැමිණ සිටි ආරාධිත අමුත්තා ඇතුළු අනෙකුත් පිරිස ඉතා උණුසුම් ව පිළිගනු ලැබුවා ය.

සහතික පත්‍ර පාඨමාලා 12 ක් නියෝජනය කරමින් සිසු සිසුවියන් 290 දෙනෙකු සඳහා ප්‍රධාන අමුත්තාගේ සහ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනිගේ සුරතින් සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු විය. සිසු සිසුවියන් එකොළොස් දෙනෙකු ඔවුන් දැක් වූ කුසලතා වෙනුවෙන් පදක්කම් හිමි කරගන්නා ලදී. රෙජිස්ට්‍රාර් ඒකකය විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

කාර්යක්ෂමතා කඩඉම් විභාග

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ රෙජිස්ට්‍රාර් ඒකකය විසින් කාර්යක්ෂමතා කඩඉම් විභාග හතක් සංවිධානය කර පවත්වන ලද අතර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික පර්යේෂණ සභාව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, කාර්මික තාක්ෂණික ආයතනය, අධිකරණ අමාත්‍යාංශය සහ වෘත්තීය පුහුණු අධිකාරියෙහි සේවකයන් 619 දෙනෙකු සඳහා විභාග පවත්වන ලදී.

පර්යේෂණ සහ ප්‍රකාශන ඒකකය



2021 වර්ෂයේ දී පර්යේෂණ කිහිපයක් සිදු කිරීමට මෙන් ම පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කිරීමටත් මෙම පර්යේෂණ සහ ප්‍රකාශන ඒකකය සමත් විය. කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් සංවිධානය කරන ලද පර්යේෂණ සමුළුවේ දී ක්‍රීඩා ක්ෂේත්‍රය කෙරෙහි කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ දීර්ඝ කාලීන බලපෑම් පිළිබඳ පර්යේෂණයක් සහ ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද ශාස්ත්‍රීය විෂය පිළිබඳ පර්යේෂණ - 2021 පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සමුළුවේ දී කාබනික වගාව සඳහා ගොවීන්ගේ සූදානම සහ එම පරිවර්තනය නිෂේධනය කරන්නා වූ සාධක පිළිබඳ පර්යේෂණයක් ඉදිරිපත් කරන ලදී. කාබනික වගාව පිළිබඳ පර්යේෂණය වැලිගම, වැලිපිටියේ පදිංචි ගොවීන් 109 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

2021 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පුවත් (ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පුවත් පත්‍රිකාව) ප්‍රකාශයට පත් කරන ලද අතර, පවත්නා තත්ත්වය හේතුවෙන් අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රකාශන (සමාජ මාධ්‍ය සහ වෙබ් පිටු) එළි දැක්වීම සඳහා දිරි ගැන්වීය.

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ 2022/23 වර්ෂය සඳහා වූ විස්තර පත්‍රිකාව ද කෙටුම්පත් කිරීම සිදු කරන ලදී. මාර්ගගතව ප්‍රචාරණය ලබා දීමේ අරමුණින් වීඩියෝපට නිර්මාණය කිරීම ද සිදු විය. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2020, කාර්ය සාධන වාර්තා -2020/21, සහ පර්යේෂණ යොජනාවලි ද සකස් කෙරුණි.

පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය





රටේ පැවති වාතාවරණය හේතුවෙන් වසරේ මැද භාගය තුළ දී ඉතා සීමිත පිරිසක් පමණක් පුස්තකාලය භාවිත කිරීමට යොමු විය. කෙසේ වුව ද, මාර්ගගත පුහුණුව සඳහා කියවීමට අවශ්‍ය ලිපිලේඛන අන්තර්ජාලය තුළින් ලබා ගැනීමේ පහසුකම සලසන ලදී.

මෙම වර්ෂයේ දී, උපදේශනය, ජ්‍යෝතිශය, ව්‍යාපෘති කළමනාකරණය සහ පර්යේෂණ යන විෂයන්ට අදාළ නව පොත් 62 ක් පුස්තකාලයට ලබා දෙමින් පුස්තකාල පොත් එකතුව වැඩි දියුණු කෙරුණි.

හවුල්කාරිත්වය සහ විශේෂ උත්සව

ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් සිය උසස් අධ්‍යාපනික වපසරිය ලංකාවේ අනෙකුත් ප්‍රදේශ අතර ද පුළුල් කිරීමේ අරමුණින් පාර්ශ්වකාර සංවිධාන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹෙන ලදී. ඒ අනුව, **ශ්‍රී ලංකා පදනම් ආයතනය, ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ එක් ව සිය** ශාඛා ආයතන මඟින් උපාධිය දක්වා අධ්‍යාපනය ලැබිය හැකි උසස් ජාතික ඩිප්ලෝමා පිරිනැමීම සිදු කරනු ඇත. මෙහි නිල උත්සවය 2021 මාර්තු 23 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවති අතර, ශ්‍රී ලංකා පදනම් ආයතනය පාර්ශ්වකාර සංවිධාන 20 ක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹුණි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනි චම්පිකා අමරසේකර, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂ (අධ්‍යයන) ආචාර්ය ආර්.එම්.විජේරත්න සහ ලින්කන් විශ්වවිද්‍යාලයේ නිත්‍ය අධ්‍යක්ෂ රෝෂාන් ද ලීමා යන මහත්ම මහත්මීන් මෙම උත්සව අවස්ථාවට සහභාගි විය.

රාජ්‍ය තාන්ත්‍රික කාර්ය



ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහකොමසාරිස් ගරු තරෙක් එම්ඩී අරිෆුල් ඉස්ලාම් මහතා 2021 ජූනි 29 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපති ජ්‍යෙෂ්ඨ නීතිඥ චම්පිකා අමරසේකර මහත්මිය එම ආයතනයේ දී හමු විය. අධ්‍යාපනික පැතිකඩ පුළුල් කිරීමටත් දෙරට අතර සහයෝගීතාවයේ නවමානයන් ගවේෂණයටත් ශ්‍රී ලංකා පදනම් ආයතනයට තවදුරටත් සහයෝගය ලබාදීම මහකොමසාරිස්වරයාගේ මෙම නිල සංචාරයේ අරමුණ විය.

ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය - සිනමාකරණ පාඨමාලාව





2021 වර්ෂයේ දී යථාර්ථයක් බවට පත් කර ගැනීමට අවකාශය ලද ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය, දිගු කාලයක සිට පැවති අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සිනමාකරණය පිළිබඳ ආදි කණ්ඩායම් ත්‍රිත්වයෙහි ම සිසුන් විසින් ශ්‍රී ලංකාවේ සිනමා කර්මාන්තය එහි ඊළඟ පියවර තෙක් ඔසවා තැබීම සඳහා සිය සහයෝගයෙන් එක්සත් විය.

ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් සංවිධානය කරන ලද මෙම රැස්වීම සඳහා පසුගිය කණ්ඩායම් ත්‍රිත්වය ම නියෝජනය කරමින් සිසුන් සහභාගි වූ අතර, එහි දී දෙවන කණ්ඩායම නියෝජනය කරනු ලබන චමිල් ජයනෙත්ති මහතා සංගමයේ සභාපති වශයෙන් තේරී පත් විය. සාමාජිකයන් පහළොස් දෙනෙකුගෙන් යුතු විධායක කමිටුවක් තෝරා පත්කර ගන්නා ලදී. සිසුන්ගේ නිර්මාණ පිළිබඳ ව මෙන් ම සිනමා අරමුදල පිළිබඳ ව මූලික සාකච්ඡා පැවැත්වීම මෙම සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂයට අදාළ ව ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් සිදු කරන ලද කාර්යයන් අතුරින් විශේෂිත ය.

ආයතනිකව සහයෝගිතාවයෙන් සිදු කළ විවෘත කිරීම්

Q - වෙළඳසැළ



වෙළඳ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ එක් ව දෙවන Q - වෙළඳසැළ, කොළඹ නිදහස් චතුරස්‍රයේ දී 2021 ජනවාරි 21 වන දින විවෘත කරන ලදී. මෙම සාමාරම්භක උත්සව අවස්ථාව සඳහා වෙළඳ අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා, තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මහතා සහ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනි චම්පිකා අමරසේකර මහත්මිය සහභාගි විය. සිල්ලර වෙළඳ ජාලයක් වන Q - වෙළඳසැළ ආරම්භ කිරීමේ පරමාර්ථ වන්නේ මහජනයා වෙත අවම මිලකට භාණ්ඩ අලෙවි කිරීමෙන් නව රැකියා අවස්ථා උත්පාදනය සහ තරුණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම ය.

කාබනික ආහාර සැපයුම් මධ්‍යස්ථානය





ශ්‍රී ලංකා පදනම් ආයතනය, එස්ට්‍රටජියා සිංගප්පූරු පුද්ගලික ආයතනය සමඟ සහයෝගයෙන් ශ්‍රී ලාංකේය, විෂ රහිත, ස්වාභාවික ආහාර කුටියක් 2021 ඔක්තෝම්බර් 14 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි විවෘත කරන ලදී. පරිභෝජනය සඳහා ස්වාභාවික ආහාර සැපයීමත්, කුඩා සහ මධ්‍යම පරිමාණයේ කෘෂි ව්‍යවසායකයන් විදේශීය සහ දේශීය වෙළඳපළට හඳුන්වාදීමත් මෙහි ප්‍රධාන පරමාර්ථය විය. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනි නීතිඥ චම්පිකා අමරසේකර මහත්මිය සහ අධ්‍යක්ෂ (අධ්‍යයන) මෙන් ම අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) ආචාර්ය ආර්.එම්.විජේරත්න මහතා මෙම වෙළඳ කුටි විවෘත කිරීම සඳහා එක් විය.

ප්‍රවීණ රංගන ශිල්පී විල්සන් ගුණරත්න, හේෂාන් දේවප්‍රිය, ශාන්ත කුමාර, එස්ට්‍රටජියා සිංගප්පූරු පුද්ගලික ආයතනයේ සම සභාපති සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය භාරත හේරත් යන මහත් මහත්මීන් ද මෙම අවස්ථාව සඳහා සහභාගි වී සිටියහ.

යටිතල පහසුකම් සංවර්ධනය

මාර්ගගත අධ්‍යාපනය



ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ඉගෙනුම් කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කරනු ලැබූ අතර, මෙම වර්ෂයේ දී එකී පද්ධතිය උපකාරී කර ගනිමින් පාඨමාලා කටයුතු සිදු කරන ලදී. වසංගත කාලය අතරතුර දී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පද්ධතිය බෙහෙවින් ඉවහල් විය.

මාර්ගගතව පුහුණු ලබාදීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම මඟින් ලබා ගත හැකි වූ අමතර වාසියක් වන්නේ, රටේ විවිධ ප්‍රදේශවල මෙන් ම ලොව පුරා විසිරී සිටින පුද්ගලයන්ට ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සඳහා සහභාගි වීමේ අවස්ථාව සැලසීම ය.

සම්මන්ත්‍රණ ශාලාව



සංස්ථාපිත රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීමට යෝග්‍ය වන පරිදි නව සම්මන්ත්‍රණ ශාලාවක් ප්‍රධාන පිවිසුම් ශාලාවේ පවතින ඉඩ අවකාශය ප්‍රයෝජනයට ගනිමින් ඉදි කරන ලදී. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ රථ ගාල ද වැඩි වාහන සංඛ්‍යාවක් නැවැත්වීමේ පහසුකම මෙන් ම ආයතනයට නව මුහුණුවරක් ලබා දීම සඳහා නවීකරණය කරනු ලැබීය.

සේවක සුභසාධනය





ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අලුත් අවුරුදු උත්සවය 2021 අප්‍රේල් 5 වන දින කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් නිල වශයෙන් පැවැත්වුණි. උත්සවයේ සමාරම්භක අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සභාපතිනිය සහභාගි වූ අතර, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සුභසාධක සංගමය විසින් උත්සව සංවිධානය කරන ලදී.

2021 දී ක්‍රියාත්මක කරන ලද පාඨමාලා ලැයිස්තුව (ජනවාරි - දෙසැම්බර්)

ආචාර්ය උපාධි වැඩසටහන් - 2021

අංකය	පාඨමාලා වර්ගය	පාඨමාලාවේ නම	පාඨමාලා ගාස්තුව (ශ්‍රී.ලං.රු)	සහභාගි වන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසන් කරන දිනය	සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය
1	ආචාර්ය උපාධිය	ආචාර්ය උපාධිය (අධ්‍යාපනය, ඉංග්‍රීසි, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව)	850,000.00	25	28/12/2020	28/12/2023	වසර 3
2	ආචාර්ය උපාධිය	ආචාර්ය උපාධිය (උපාය මාර්ගික කළමණාකරණය, කාර්මික කළමණාකරණය, ව්‍යාපාර පරිපාලනය, කළමණාකරණය, ගිණුම්කරණය, සත්කාරක කළමණාකරණය, තොරතුරු තාක්ෂණය)	1,000,000.00	17	28/12/2020	28/12/2023	වසර 3
3	ආචාර්ය උපාධිය	ආචාර්ය උපාධිය (හෙද, ඉංජිනේරු)	1,200,000.00	1	28/12/2020	28/12/2023	වසර 3

උපාධි වැඩසටහන් - 2021

අංකය	පාඨමාලා වර්ගය	පාඨමාලාවේ නම	පාඨමාලා ගාස්තුව (ශ්‍රී.ලං.රු)	සහභාගි වන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසන් කරන දිනය	සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය
1	උපාධි	මනෝවිද්‍යාවේ දී උපාධිය - 3 වන අධ්‍යයන වාරය	350,000.00	24	23/07/ 2021	23/10/ 2023	වසර 1 මාස 6
2		මනෝවිද්‍යාවේ දී උපාධිය - 4 වන අධ්‍යයන වාරය	400,000.00	14	23/10/ 2021	23/10/ 2023	වසර 2

උසස් ජාතික ඩිප්ලෝමා - 2021

අංකය	පාඨමාලා වර්ගය	පාඨමාලාවේ නම	භෞතික					මූල්‍යමය	
			අපේක්ෂිත සංඛ්‍යාව	සහභාගි වන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසාන කරන දිනය	සම්පූර්ණ කිරීමට ගතවන කාලය	පාඨමාලා ගාස්තු (ශ්‍රීල.රු)	බලාපොරොත්තු වන ආදායම (ශ්‍රීල.රු)
1	දෘෂ්ඨි විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2019)	HND/OPT/E/2019	25	25	05/05/2019	05/05/2022	වසර 3	388,600.00	9,715,000.00

2	චිත්‍රපට නිර්මාණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2019)	HND/FM/B/2019	23	18	2/05/2019	22/12/2021	වසර 3	495,000.00	8,910,000.00
3	දේශපාලන සහ රාජ්‍ය කළමණාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2019)	HND/PPM/B/2019	25	10	04/08/2019	04/09/2019	වසර 1	66,500.00	665,000.00
4	උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව (සෙන.) (2019) 2 වන කණ්ඩායම	HND/COU/B2/2019	50	57	21/09/2019	21/09/2020	වසර 1 (සෙන)	100,000.00	5,700,000.00
5	මනෝ චිකිත්සාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2019)	HND/ PSY/B/2019	21	24	14/12/2019	14/12/2020	වසර 1	85,600.00	2,054,400.00
6	මානව සම්පත් කළමණාකරණය සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2019)	HND/HRM&PD/B/2019	30	19	30/06/2020	30/01/2021	වසර 1	75,000.00	1,425,000.00
7	ව්‍යවහාරික අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2020)	HND/ACC/01/2020	35	27	16/08/2020	20/09/2020	වසර 1	55,400.00	1,495,800.00
8	මනෝ චිකිත්සාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2020) (ඉරිදා)	HND/PSY/01/2020	35	18	16/08/2020	20/09/2021	වසර 1	85,600.00	1,540,800.00
9	අපරාධ නීතිය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2020)	HND/CL/B/2020	50	42	20/09/2021	20/09/2021	වසර 1	66,500.00	2,793,000.00
10	පවුල් උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2020) - මාර්ගගත	HND/FC/2020	25	14	06/12/2020	06/12/2021	වසර 1	70,000.00	980,000.00

11	උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2020)	HND/COU/B/2021	35	48	14/02/2021	14/02/2022	වසර 1	110,000.00	5,280,000.00
12	මනෝවිද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව)	HND/PSY/B/2021	35	10	14/08/2021	14/02/2023	වසර 2	282,000.00	2,820,000.00
13	ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව)	HND/ENG/E/2021	35	10	14/08/2021	14/02/2023	වසර 2	282,000.00	2,820,000.00
14	මනෝ චිකිත්සාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (2021)	HND/PSY/B/2021	30	22	21/08/2021	21/08/2022	වසර 1	85,600.00	1,883,200.00
15	මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (ලින්කන් විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව)	HND/ECE/B/2021	35	12	12/09/2021	12/09/2023	වසර 2	282,000.00	3,384,000.00
16	අපරාධ නීතිය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (2021)	HND/CL/B/2021	35	32	12/12/2021	12/12/2022	වසර 1	68,700.00	2,198,400.00
17	ව්‍යවහාරික අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්ති ක්‍රමය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (2021)	HND/ACC/S/2021	30	34	19/12/2021	19/12/2022	වසර 1	55,400.00	1,883,600.00

ජාතික ඩිප්ලෝමා - 2021

අංකය	පාඨමාලා වර්ගය	පාඨමාලාවේ නම	භෞතික					මූල්‍යමය	
			අපේක්ෂිත සංඛ්‍යාව	සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසන් කරන දිනය	සම්පූර්ණ කිරීමට ගතවන කාලය	පාඨමාලා ගාස්තුව (ශ්‍රීලං.රු)	බලාපොරොත්තු වන ආදායම (ශ්‍රීලං.රු)
01	තොරතුරු තාක්ෂණය සහ රාජ්‍ය අංශය කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	NDP/ITPSM/01/2019	100	50	01-06-2019	01-03-2020	මාස 6 ඊ-ගේට් (ඔන්ලයින්)	30,000.00	1,500,000.00
02	ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (2019)	NDP/DP/B/2019	45	23	01-06-2019	01-07-2020	වසර 01	55,000.00	1,265,000.00
03	තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	NDP/ITHRM/01/2019	100	17	02-06-2019	02-03-2020	මාස 6 ක ඊ-ගේට් (ඔන්ලයින්)	30,000.00	510,000.00
04	ක්‍රීඩා ශක්තිය සහ සමීකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2019	NDP/SSC/B/2019	45	38	28-06-2019	28-06-2020	වසර 1 මාස 6	66,500.00	2,527,000.00
05	තොරතුරු තාක්ෂණය සහ රාජ්‍ය අංශය කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	NDP/ITPSM/01/2020	100	7	10-01-2020	10-08-2020	මාස 6 ක ඊ-ගේට් (ඔන්ලයින්)	30,000.00	210,000.00
06	තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	NDP/ITHRM/01/2020	100	23	10-01-2020	10-08-2020	මාස 6 ක ඊ-ගේට් (ඔන්ලයින්)	30,000.00	690,000.00

07	ජාතික වෘත්තීය මාර්ගෝපදේශන ඩිප්ලෝමාව 2020	NDP/CG/B/2020	40	36	12-01-2020	12-01-2021	වසර 01	60,000.00	2,160,000.00
08	ජ්‍යොතිෂය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2020	NDP/AST/S/2020	30	19	15-02-2020	15-03-2021	වසර 01	62,900.00	1,195,100.00
09	ඉංග්‍රීසි වෘත්තිය සංවර්ධනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2020	NDP/ENG/E1/2020	25	8	23-02-2020	30-08-2020	වසර 01	67,000.00	536,000.00
10	ජාතික උපදේශන ඩිප්ලෝමාව - ද්විභාෂා 2020	NDP/COU/B/2020	35	58	18-07-2020	26-07-2021	වසර 01	65,000.00	3,770,000.00
11	ජාතික උපදේශන ඩිප්ලෝමාව - ඉංග්‍රීසි 2020	NDP/COU/E/2020	35	32	18-07-2020	26-07-2021	වසර 01	65,000.00	2,080,000.00
12	වයස්ගත රැකවරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - ඔන්ලයින් 2020	NDP/AC/B1/2020	30	17	16-08-2020	16-10-2021	මාස 6	34,000.00	578,000.00
13	නර්තන ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2020	NDP/CHO/B/2020	35	20	07-09-2020	07-09-2021	වසර 01	105,000.00	2,100,000.00
14	ක්‍රීඩා ශක්තිය සහ සමීකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2020	NDP/SSC/B/2020	60	44	30-09-2020	29-12-2021	වසර 01 මාස 06	66,500.00	2,926,000.00
15	මානව සම්පත් කළමණාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - (Matrix) 2020	NDP/HRM/S/2020	30	23	11-10-2020	11-12-2020	මාස 04	19,000.00	437,000.00
16	ජාතික වෘත්තීය මාර්ගෝපදේශන ඩිප්ලෝමාව - 2021	ND/CGU/B/2021	50	35	31-01-2021	26-12-2031	වසර 01	60,000.00	2,100,000.00

17	මානව සම්පත් හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව අනුකෘති අනුවාදය 2021	NDP/HRM /B/2021	50	25	14-02-2021	04-04-2021	මාස 04	25,000.00	625,000.00
18	ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2021	NDP/DP/B/2021/21	35	18	20-03-2021	20-03-2021	වසර 01	62,500.00	1,125,000.00
19	චෙස් කෝචිං පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2021	NDP/CC/B/2021	25	12	19-06-2021	19-06-2022	වසර 01	48,000.00	576,000.00
20	ව්‍යාපාර පරිපාලනය සහ මානව සම්පත් පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2021	ND/HRM/B2/2021	30	20	27-06-2021	26-12-2021	මාස 06	25,000.00	625,000.00
21	වයස්ගත රැකවරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2021	ND/AC/B2/2021	20	20	12-09-2021	12-09-2022	වසර 01	70,000.00	1,190,000.00
22	වයස්ගත රැකවරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජර්මානු වීසා) - 2021	ND/AC/B/2021	20	17	20-09-2021	20-09-2022	වසර 01	72,500.00	1,232,500.00
23	නාට්‍ය චිකිත්සාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - 2021	ND/DRT/B1/2021	25	25	30-10-2021	02-01-2022	වසර 01	118,500.00	2,962,500.00
24	ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව සහ HRM - 2021	ND/HRM/B3/2021	30	22	03-10-2021	02-04-2022	මාස 6	25,000.00	550,000.00
25	කාන්තා පොලිස් නිළධාරිනියන් සඳහා මනෝවිද්‍යාව සහ උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - මාර්ගගත	ACER/P&C/1/2021	20	20	27-10-2021	02-05-2022	පැය 200	32,200.00	644,000.00
26	ජාතික උපදේශන ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) - 2021	NDP/COU/E/2021	38	31	20-11-2021	20-11-2022	වසර 01	70,000.00	2,170,000.00

27	ජාතික උපදේශන ඩිප්ලෝමාව (සිංහල) - 2021	NDP/COU/S/2021	42	57	20-11-2021	20-11-2022	වසර 01	70,000.00	3,990,000.00

සහතික පාඨමාලා - 2021

අංකය	පාඨමාලා වර්ගය	පාඨමාලාවේ නම	භෞතික					මූල්‍යමය	
			අපේක්ෂිත සංඛ්‍යාව	සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසන් කරන දිනය	සම්පූර්ණ කිරීමට ගතවන කාලය	පාඨමාලා ගාස්තුව (ශ්‍රී.ලං.රු)	බලාපොරොත්තු වන ආදායම (ශ්‍රී.ලං.රු)
01	මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ උසස් සහතිකය (Metrix) - 2020	ACER/PCOU/03/2020	21	22	10-10-2020	27-01-2021	මාස04	22,500.00	495,000.00
02	මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ උසස් සහතිකය	ACER/PCOU/01/2021	30	40	21-01-2021	31-08-2021	මාස04	22,500.00	900,000.00
03	ජ්‍යෝතිෂ ශාස්ත්‍රය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021	ACER/AST/01/2021	30	13	25-01-2021	31-05-2021	මාස 03	29,000.00	377,000.00
04	මානව සම්පත් කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021	ACER/HRM/01/2021	50	28	10-02-2021	22-05-2021	මාස03	15,000.00	420,000.00
05	ව්‍යවහාරික අපරාධ විද්‍යාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)- 2021	ACER/AC/01/2021	30	19	20-02-2021	31-08-2021	මාස04	14,600.00	277,400.00

06	වෘත්තීය සංවර්ධනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)- 2021	ACER/PD/01/2021	13	12	08-05-2021	08-11-2021	මාස03	12,000.00	144,000.00
07	දිවුරුම් දුන් පරිවර්තකයින් සඳහා පරිවර්තන - 2021 හි උසස් සහතික පත්‍ර පාඨමාලාව	ACER/TS/01/2021	30	13	08-05-2021	20-05-2021	මාස03	15,800.00	205,400.00
08	ව්‍යාපාරික පරිපාලනය සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව -2021	ACER/HRM/02/2021	58	46	29-05-2021	25-08-2021	මාස 03	15,000.00	690,000.00
09	ළමා මනෝවිද්‍යාව සහ ළමා ආරක්ෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව -2021 (01 කණ්ඩායම)	ACER/ CPCP/01/2021	40	49	28-06-2021	18-10-2021	මාස 03	18,500.00	906,500.00
10	ළමා මනෝවිද්‍යාව සහ ළමා ආරක්ෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත) - ජී3 - 2021	ACER/ CPCP/02/2021	40	29	28-06-2021	18-10-2021	මාස 03	18,500.00	536,500.00
11	මානව සම්පත් කළමණාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021	ACER/HRM/03/2021	50	20	25-08-2021	24-11-2021	මාස 03	15,000.00	300,000.00
12	මනෝවිද්‍යා උපදේශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව -2021	ACER/PCOU/02/2021	25	29	29-10-2021	01-02-2022	මාස 04	29,500.00	855,500.00
13	පරිගණක යෙදුම් සහකාර සඳහා සහතික පත්‍ර පාඨමාලාව (3 වන මට්ටම)-2019	CER/CAAL3/01/2019	100	10	10-01-2020	දිගටම කරගෙන යනවා	මාස 4(ඊගේට්/ ඔන්ලයින්)	15,000.00	150,000.00
14	ICT කාර්මික ශිල්පියා සඳහා සහතිකය (4 වන මට්ටම) - 2020	CER/CAAL4/01/2020	60	8	11-01-2020	දිගටම කරගෙන යනවා	මාස6 (ඊගේට්/ ඔන්ලයින්)	20,000.00	160,000.00

59	පරිගණක යෙදුම් සහකාර (මට්ටම 3) - 2019	CER/CAAL3/01/2019	100	10	15-06-2019	දිගටම කරගෙන යනවා	මාස 4(ඊගේට්/ ඔන්ලයින්)	15,000.00	150,000.00
60	ක්‍රීඩා සහායකවරුන් සහ භෞතික චිකිත්සක සහකරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව -2019	CER/SMP/02/2019	40	51	26-09-2019	09-07-2019	වසර 01	80,000.00	4,080,000.00
61	පරිගණක යෙදුම් සහකාර සඳහා සහතික පත්‍ර පාඨමාලාව (3 වන මට්ටම) - 2019	CER/CAAL3/01/2019	100	10	10-01-2020	දිගටම කරගෙන යනවා	මාස 4(ඊගේට්/ ඔන්ලයින්)	15,000.00	150,000.00
62	ICT කාර්මික ශිල්පියා සඳහා සහතික පත්‍ර පාඨමාලාව (4 වන මට්ටම) - 2020	CER/CAAL4/01/2020	60	8	11-01-2020	දිගටම කරගෙන යනවා	මාස6 (ඊගේට්/ ඔන්ලයින්)	20,000.00	160,000.00
63	ප්‍රවෘත්ති කියවීමේ සහතික පත්‍ර පාඨමාලාව -2020	CER/NR/01/2020	35	18	15-02-2020	11-07-2020	මාස 06	44,000.00	792,000.00
64	ක්‍රීඩා සම්භාෂන විශේෂඥයින් සහ භෞතික චිකිත්සක සහකරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව -2020	CER/SM/01/2020	100	51	11-08-2020	29-06-2021	වසර 01	80,000.00	4,080,000.00
65	යෝග්‍යතා පුහුණුකරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව - 2020	CER/FIT/01/2020	60	60	14-08-2020	04-12-2020	මාස 04	16,000.00	960,000.00
66	දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිසම්පාදන ක්‍රියාවලියේ සහතික පත්‍ර පාඨමාලාව -2020	CER/PP/01/2020	20	20	27-08-2020	24-12-2020	දින 5	19,400.00	388,000.00
67	කැමරා වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ද්විභාෂා) - 2020	CER/CW/01/2020	16	10	30-08-2020	27-12-2020	දින 17	53,000.00	530,000.00
68	රේඛීය නොවන වීඩියෝ සංස්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -2020	CER/NLE/01/2020	25	8	29-08-2020	09-01-2021	මාස 05	40,000.00	320,000.00

69	කථන ඉංග්‍රීසියෙන් සහතිකය (ඔන්ලයින්) (1 කොටස)-2020	CER/CON/ E1/2020	20	22	01-12-2020	01-03-2021	මාස 03	12,000.00	264,000.00
70	අභ්‍යන්තර සැලසුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -2020	CER/ID/01/2020	13	13	13-12-2020	13-06-2021	මාස 06	30,000.00	390,000.00
71	මිනුම් උපකරණ සහ සේවා පරීක්ෂකවරුන් සඳහා නීති පුහුණුව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -2021	CER/LTM/On/01/2021	23	27	11-01-2021	27-01-2021	දින 10	9,000.00	243,000.00
72	ලේඛන කුසලතා (විධායක නොවන) ශ්‍රී ලංකා බලශක්ති - (මාර්ගගත) සහතික පත්‍ර පාඨමාලාව - 2021	CER/PCS/01/2021	9	9	15-01-2021	15-04-2021	මාස 03	13,300.00	119,700.00
73	ඉංග්‍රීසි කථනය (ඔන්ලයින්) පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - (2 කොටස)	CER/CON/E1/2021	20	11	02-02-2021	02-05-2021	මාස 03	11,800.00	129,800.00
74	වෘත්තීය ජනමාධ්‍යවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	CER/PJ/01/2021	25	2	06-02-2021	06-05-2021	මාස 03	18,000.00	36,000.00
75	පරිවර්තනය සහ අර්ථ නිරූපණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දෙමළ සහ ඉංග්‍රීසි) - මාර්ගගත	CER/T&A/T01/2021	12	14	18-02-2021	18-05-2021	මාස 03	14,000.00	196,000.00
76	ඉංග්‍රීසි කථනය ඔන්ලයින් සහතික පත්‍ර පාඨමාලාව - (2 කොටස)	CER/CON/E2/2021	15	12	05-04-2021	10-08-2021	මාස 04	15,000.00	180,000.00
77	යෝග්‍යතා පුහුණුකරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව	CER/FIT/01/2021	60	45	23-04-2021	27-09-2021	මාස 04	16,000.00	720,000.00
78	සමාජ සැලසුම්කරණය සහ සංවර්ධනය පිළිබඳ සහතිකය (ඔන්ලයින්)	CER/SPD/01/2021	18	16	19-06-2021	25-09-2021	මාස 04	12,400.00	198,400.00

79	මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සඳහා නීති පුහුණුව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	CER/LTM/On/02/2021	40	25	13-07-21	17-09-2021	දින 10	9,000.00	225,000.00
80	චීන භාෂාවෙන් සහතික පත්‍ර පාඨමාලාව - (ඔන්ලයින්)	CER/CHN/01/2021	22	17	11-07-2021	11-11-2021	මාස 03	20,000.00	340,000.00
81	කොරියානු භාෂාවෙන් සහතික පත්‍ර පාඨමාලාව - (ඔන්ලයින්)	CER/KL/01/2021	18	10	13-07-2021	30-11-2021	මාස 03	20,000.00	200,000.00
82	ජපන් භාෂාවෙන් සහතික පත්‍ර පාඨමාලාව - (ඔන්ලයින්)	CER/Jpn//01/2021	18	4	19-07-2021	10-12-2021	මාස 03	20,000.00	80,000.00
83	හින්දි භාෂාවෙන් සහතික පත්‍ර පාඨමාලාව - (ඔන්ලයින්)	CER/HN/01/2021	18	7	19-08-2021	09-01-2021	මාස 03	20,000.00	140,000.00
84	ක්‍රීඩා සහායකවරුන් සහ භෞතික චිකිත්සක සහායකවරුන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව	CER/SMP/01/2021	40	64	16-09-2021	16-04-2022	මාස 08	80,000.00	5,120,000.00
85	ඉංග්‍රීසි කථනය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - STF නිළධාරීන්	CER/STF/01/2021	30	30	03-11-2021	03-02-2021	මාස 03	11,500.00	345,000.00
86	කොටස් වෙළඳපොළ ආයෝජනය පිළිබඳ සහතික පාඨමාලාව	CER/SMI/01/2021	27	30	27-11-2021	31-12-2021	සති 6	17,000.00	510,000.00
87	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - NYSC	CER/CGU/01/2021	40	36	29-11-2021	20-12-2021	දින 08	33,000.00	1,188,000.00

වැඩමුළු -2021

අංකය	වැඩමුළුවේ නම	වැඩමුළු අංකය	භෞතික					මූල්‍යමය	
			අපේක්ෂිත සංඛ්‍යාව	සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව	ආරම්භ කරන දිනය	අවසන් කරන දිනය	සම්පූර්ණ කිරීමට ගතවන කාලය	පාඨමාලා ගාස්තුව (ශ්‍රී.ලං.රු.)	බලාපොරොත්තු වන ආදායම (ශ්‍රී.ලං.රු.)
1	NAITA සඳහා මූල්‍ය රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන	SLF/02/PSW/WS/FR/2021-02	35	36	21-01-2021	03-02-2021	දින 5	15,400.00	554,400.00
2	චිත්‍රපට ප්‍රදර්ශනය - චිත්‍රපට 4 ක්	SLF/02/SM/FS/B/2021-01	75	50	22-01-2021	22-01-2021	දින 01	1,600.00	80,000.00
3	ජනමාධ්‍ය අමාත්‍යාංශය හා එක් ව ශ්‍රී ලංකා මාධ්‍ය අධ්‍යයන ආයතනය SLIMS පිහිටුවීම පිළිබඳ වැඩමුළුව	SLF?02/SLIMS/Comm/2021	15	15	18-02-2021	08-02-2021	දින 01	1,850.00	27,750.00
4	වෛද්‍ය කේ සහ දෘඪ ටේප් යෙදුම පිළිබඳ වැඩමුළුම	SLF/02/BH/WS/MT/2021/01	25	15	24-02-2021	24-02-2021	දින 01	7,000.00	105,000.00
5	වෛද්‍ය කේ සහ දෘඪ ටේප් යෙදුම පිළිබඳ වැඩමුළුම	SLF/02/BH/WS/MT/2021/02	30	33	03-02-2021	03-03-2021	දින 01	7,000.00	231,000.00
6	රෙදිපිළි ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව	SLF/02/RMV/Ws/Awa./2021-01	50	48	12-03-2021	12-03-2021	දින 01	8,500.00	408,000.00
7	රෙදිපිළි ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව	SLF/02/RMV/Ws/Awa/2021-02	50	21	13-03-2021	13-03-2021	දින 01	8,700.00	182,700.00

8	ජනමාධ්‍ය අමාත්‍යාංශය හා එක්ව ශ්‍රී ලංකා මාධ්‍ය අධ්‍යයන ආයතනය (SLIMS) පිහිටුවීම පිළිබඳ වැඩමුළුව	SLF/02/SLIMS/comm /2021	15	15	15-03-2021	15-03-2021	දින 01	5,009.00	75,135.00
9	බතික් සහ අත්කම් ගම්මාන ව්‍යාපෘතිය සඳහා පුහුණුකරුවන් පිළිබඳ වැඩමුළුව	SLF/02/RMV/Ws/TOT/2021-01	50	49	18-03-2021	19-03-2021	දින02	18,000.00	882,000.00
10	බතික් සහ අත්කම් ගම්මාන ව්‍යාපෘතිය සඳහා පුහුණුකරුවන් පිළිබඳ වැඩමුළුව	SLF/02/RMV/Ws/TOT/2021-02	50	48	20-03-2021	21-03-2021	දින02	18,000.00	864,000.00
11	බතික් සහ අත්කම් ගම්මාන ව්‍යාපෘතිය සඳහා පුහුණුකරුවන් පිළිබඳ වැඩමුළුව	SLF/02/RMV/Ws/TOT/2021-03	50	53	22-03-2021	22-03-2021	දින 01	18,000.00	954,000.00
12	බතික් සහ අත්කම් ගම්මාන ව්‍යාපෘතිය සඳහා පුහුණුකරුවන් පිළිබඳ වැඩමුළුව	SLF/02/RMV/Ws/TOT/2021-04	50	58	23-03-2021	23-03-2021	දින 01	18,000.00	1,044,000.00
13	ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	SLF/02/Al/Wor/Pro/E/2021-1	40	49	24-03-2021	25-03-2021	දින02	8,000.00	392,000.00
14	රෙදිපිළි ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව	SLF/02/RMV/Ws/Awa/2021-03	50	38	24-03-2021	24-03-2021	දින 01	8,700.00	330,600.00
15	රෙදිපිළි ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව	SLF/02/RMV/Ws/Awa/2021-03	50	38	25-03-2021	25-03-2021	දින 01	8,700.00	330,600.00
16	රජයේ නිළධාරීන් සඳහා පුද්ගලික ලිපිගොනු හැසිරවීම පිළිබඳ වැඩමුළුව	SLF/02/PSW/Ws/PFH/2021	30	57	31-03-2021	31-03-2021	දින 01	3,800.00	216,600.00

17	විමුක්ති ජයසුන්දර සමඟින් Transcendal Cinema පිළිබඳ වැඩමුළුව	SLF/02/SM/FS/B/2021-01	25	39	02-04-2021	04-04-2022	දින03	10,000.00	390,000.00
18	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා වැඩමුළුව	SLF/02/WU/WOR/OUT/2021-1	50	45	05-04-2021	09-04-2021	දින05	5,500.00	247,500.00
19	කාර්යාල කළමණාකරණය පිළිබඳ වැඩමුළුව	SLF/02/Al/WOR/OFM/E/2021-1	30	17	07-04-2021	08-04-2021	දින02	8,000.00	136,000.00
20	''විශිෂ්ඨ ගුරුවරයෙකු වන්න'' වැඩමුළුව	SLF/02/PSW/Ws/BET/2021	30	18	08-04-2021	09-04-2021	දින02	7,300.00	131,400.00
21	ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළුව	SLF/02/PSW/Ws/PP/2021	30	26	08-04-2021	09-04-2021	දින02	7,900.00	205,400.00
22	මාර්ගගත පුහුණුකරු පුහුණු කිරීම පිළිබඳ වැඩමුළුව	SLF/01/WOTM-on/2021	19	19	07-05-2021	16-05-2021	දින04	6,000.00	114,000.00
23	මාර්ගගත ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ වැඩමුළුව	SLF/02/WOTM-on/2021	12	12	14-06-2021	22-06-2021	දින05	11,500.00	138,000.00
24	මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සඳහා සාක්ෂ්‍ය නීතිය පිළිබඳ වැඩමුළුව	SLF/02/PSW/WOR/EL/2021	30	19	07-07-2021	16-07-2021	දින02	2,400.00	45,600.00
25	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා PRA පිළිබඳ වැඩමුළුව	SLF/02/WU/ND/WOR/PRA/2021-01	50	50	25-11-2021	26-11-2021	දින02	12,000.00	599,466.00
26	මානසික සෞඛ්‍යය පිළිබඳ වැඩමුළුව	SLF/02/WS/MHHL/01/2021-BL-02	44	55	06-11-2021	10-12-2021	දින05	69,900.00	3,844,500.00

27	ඉඩම් පරිහරණය ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා PRA පිළිබඳ වැඩමුළුව - දෙමළ	SLF/02/WU/ND/WOR/PRA/Tamil/2021-01	25	24	06-12-2021	07-12-2021	දින02	13,200.00	329,680.00
28	ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	SLF/02/AL/WOR/PRO/E/2021-01	40	39	09-12-2021	10-12-2021	දින02	8,000.00	317,342.00
29	මානසික සෞඛ්‍යය පිළිබඳ වැඩමුළුව	SLF/02/WS/MHHL/01/2021-BL-02	44	55	06-12-2021	10-12-2021	දින 05	69,900.00	3,844,500.00
30	මූලික සන්නිවේදන කුසලතා (ඔන්ලයින්)	SLF/02/BH/WOR/2021-03	33	23	14-12-2021	14-12-2021	දින 01	2,500.00	57,500.00
31	බංගලාදේශ MOH හි නියෝජිතයින් සඳහා ප්‍රතිසම්පාදන, ගබඩා කිරීම සහ සැපයුම් කළමණාකරණය	SLF/02/WS/S/BH/2021-1	4	4	21-12-2021	23-12-2021	දින 02	23,500.00	93,663.75
32	මූලික සන්නිවේදන කුසලතා (ඔන්ලයින්)	SLF/02/BH/WOR/2021-04	33	20	23-12-2021	23-12-2021	දින 01	2,500.00	50,000.00
33	ආයතනික සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩල දායකත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව	SLF/02/PSW/WOR/ICID/2021-04	15	15	27-12-2021	28-12-2021	දින 02	6,200.00	93,000.00

කඩඉම් විභාග -2021

						භෞතික		මූල්‍යය
අංකය	ආයතනය	විභාගයේ නම	දිනය	කාලය	ස්ථානය	ඉලක්කගත සහභාගිවන්නන් ගණන	සැබෑ සහභාගිවන්නන් ගණන	ලැබුණු ආදායම (ශ්‍රී.ලං.රු)
1	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	13-02-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 02.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	7	7	99,160.00
2	ජාතික පර්යේෂණ සභාව	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	31-03-2021	පෙ.ව. 9.00 සිට මධ්‍යහන 12.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	15	15	139,430.00
3	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	17-07-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 04.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	247	247	596,200.00
4	කාර්මික තාක්ෂණ ආයතනය ITI සඳහා EB විභාගය	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	14-09-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 04.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	75	75	213,880.00
5	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	23-10-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 01.30 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	10	10	177,320.00
6	අධිකරණ අමාත්‍යාංශය	තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීම සඳහා තේරීම් පරීක්ෂණය	14-11-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 04.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	153	153	293,140.00
7	වෘත්තීය පුහුණු අධිකාරිය	කාර්යක්ෂමතා කඩඉම් විභාගය	24-12-2021	පෙ.ව. 9.00 සිට ප.ව. 04.00 දක්වා	ශ්‍රී ලංකා පදනම, කොළඹ 07.	112	112	858,820.00

ශ්‍රී ලංකා පදනම

2021 දෙසැම්බර් **31** දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		2021		2020
වත්කම්	සටහන්	රු.		රු.
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත හා උපකරණ	**3**	817,184,456		836,048,244
ප්‍රාග්ධන ස්වභාවයේ - නොනිමි වැඩ	**4**	29,076,092		27,929,704
		846,260,548		863,977,948
ජංගම වත්කම්				
භාණ්ඩ තොගය	**5**	2,945,013		3,262,079
ලැබිය යුතු ගිණුම්	**6**	30,587,355		26,637,817
පෙරගෙවුම්	**7**	131,692		72,679
මුදල් හා මුදල් සමාන දෑ	**8**	42,862,755		16,588,375
		76,526,815		46,560,950
මුළු වත්කම්		922,787,363		910,538,898
වගකීම්				
ජංගම නොවන වත්කම්				
විලම්බිත ආදායම්	**9**	271,622,689		251,024,099
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**10**	30,967,024		30,822,638
		302,589,713		281,846,737
ජංගම වගකීම්				
ගෙවිය යුතු ගිණුම්	**11**	56,286,295		48,646,280
උපචිත වියදම්	**12**	21,013,970		19,959,740
		77,300,265		68,606,020
මුළු වගකීම්		379,889,978		350,452,757
මුළු ශුද්ධ වත්කම්		542,897,384		560,086,141
ශුද්ධ වත්කම්				
සමුච්චිත අරමුදල	**13**	31,020,455		6,582,809
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන	**14**	487,929,764		530,459,754
ණය අරමුදල	**15**	23,947,175		23,043,578
මුළු ශුද්ධ වත්කම්		542,897,394		560,086,141

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 5 සිට 18 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

සහතික කිරීම

ඉහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 දිනට පදනමේ කටයුතු පිළිබඳවත්, 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා එහි අතිරික්තය/ (හිඟය) පිලිබඳවත් සත්‍ය වුත් සාධාරණ වුත් දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු.

එස් එස් ඒ සෙනෙවිරත්න	**ආචාර්ය ආර් එම් විජේරත්න**
අධ්‍යක්ෂ මූල්‍ය	**අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.)**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණ මණ්ඩලය සතු වගකීමකි.
මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කලේ

චම්පිකා ඩී. අමරසේකර	**එම් කේ ඩී එන් මාදම්පෙ**
සභාපතිනිය	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**
පෙබරවාරි 25 2021	

ශ්‍රී ලංකා පදනම

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

		2021		2020
	සටහන්	රු.		රු.
මෙහෙයුම් ආදායම				
පුනරාවර්තන ප්‍රදාන		99,000,000		90,500,000
වෙනත් ආදායම්	**16**	195,811,362		153,722,233
		294,811,362		244,222,233
මෙහෙයුම් වියදම්				
පුද්ගල වේතන	**17**	116,500,338		124,870,638
ගමන් වියදම්		82,460		14,800
සැපයුම් සහ පරිභෝජන වියදම්	**18**	3,512,092		2,251,444
නඩත්තු වියදම්	**19**	9,356,520		8,890,781
කොන්ත්‍රාත් ගත සේවාවන්	**20**	22,727,616		23,191,570
පුහුණු සහ අධ්‍යාපන	**21**	37,809,736		14,843,085
වෙනත් මෙහෙයුම් වියදම්	**22**	22,269,953		20,948,347
ක්ෂයවීම්	**3**	58,272,858		59,398,688
මුළු මෙහෙයුම් වියදම්		270,531,572		254,409,353
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය)		24,279,790		(10,187,120)
අඩු - මූල්‍ය පිරිවැය	**23**	312,044		108,011
මුළු මෙහෙයුම් නොවන ආදායම/ (වියදම්)		(312,044)		(108,011)
එකතු - ස්ථාවර වත්කම් බැහැර කිරීමේදී ලාභය / (අලාභය)	**24**	469,900		(483,466)
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		24,437,646		(10,778,597)

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 5 සිට 18 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ශ්‍රී ලංකා පදනම

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම් ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය / (හිඟ)	ණය අරමුදල	එකතුව
	රු.	රු.	රු.	රු.
ශේෂය 2019 දෙසැම්බර් 31	755,258,179	(80,086,438)	21,237,106	696,408,847
ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස	-	(450,726)	-	(450,726)
ප්‍රත්‍යාගණන ගැලපුම	(75,030,000)	-	-	(75,030,000)
කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)		(9,370,945)	993,069	(8,377,876)
සංශෝධිත ශේෂය	680,228,179	(89,908,109)	22,230,175	612,550,245
2020 සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම්				
ප්‍රත්‍යාගණන සංචිතය ක්‍රමක්ෂය කිරීම	(42,530,000)	-	-	(42,530,000)
සංශෝධිත ශේෂය	637,698,179	(89,908,109)	22,230,175	570,020,245
කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)	-	(10,778,597)	844,493	(9,934,104)
2020 දෙසැම්බර් 31 දිනට නැවත ශේෂය	637,698,179	(100,686,706)	23,074,668	560,086,141
2021 සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම්				
ප්‍රත්‍යාගණන සංචිතය ක්‍රමක්ෂය කිරීම	(42,530,000)	-	-	(42,530,000)
කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)	-	24,437,646	903,598	25,341,244
2021 දෙසැම්බර් 31 වන විට ශේෂය ඉදිරියට ගෙන යන ලදී	595,168,179	(76,249,060)	23,978,266	542,897,384

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 5 සිට 18 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ශ්‍රී ලංකා පදනම

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		2021		2020
		රු.		රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය				
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය)		24,437,646		(10,778,597)
ගැලපීම්				
ක්ෂයවීම්		58,272,858		59,398,688
විලම්බිත ආදායම ක්‍රමක්ෂය කිරීම		(60,974,600)		(59,361,443)
ව්‍යාපෘති අගය ක්‍රමක්ෂය කිරීම		(3,721,881)		
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ (ලාභය) / පාඩුව		(469,900)		483,466
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		4,967,174		8,717,006
බොල් හා අඩමාණ ණය ගැනියන් සඳහා ඌණ/ (අධි) වෙන්කිරීම්		853,851		105,049
විනාශ වූ තොග කපා හැරීම		47,146		-
මූල්‍ය පිරිවැය		312,044		108,011
පරිසනක වෙනුවෙන් ලැබිය යුතු මුදල්		(81,180)		-
ඉවත්වූ සේවකයන්ගෙන් ලැබීම්		(51,920)		-
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් ගැලපීමට පෙර අතිරික්තය / (හිඟය)		23,591,237		(1,327,821)
කාරක ප්‍රාග්ධන ගැලපුම්				
භාණ්ඩ තොගය අඩු වීම / (වැඩිවීම)		317,066		887,761
වෙළඳ ණය සහ වෙනත් ලැබිය යුතු දේවල අඩුවීම /(වැඩි වීම)		(3,949,538)		10,390,704
පෙර ගෙවීම් අඩුවීම/(වැඩි වීම)		(59,013)		295,570
ගෙවිය යුතු දේවල (අඩුවීම) /වැඩි වීම		11,024,535		3,144,359
උපචිත වියදම්වල වැඩි වීම / (අඩුවීම)		1,054,231		(3,247,691)
මෙහෙයුම් අතිරික්තය / (හිඟය)		31,978,518		10,142,882
පාරිතෝෂික ගෙවීම්		(8,207,308)		(7,192,710)
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද විකුණුම් ආදායම		469,600		124,970
මූල්‍ය පිරිවැය		(312,044)		(108,011)
මෙහෙයුම් කටයුතුවලින් උත්පාදනය වන/ (භාවිතා කරන) ශුද්ධ මුදල් ප්‍රවාහය		23,928,766		2,967,131
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහය				
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම්		(40,584,978)		(49,262,194)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වන / (භාවිතා කරන) ශුද්ධ මුදල් ප්‍රවාහය		(40,584,978)		(49,262,194)
මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය				
ලැබුණු පොලී - ණය අරමුදල		930,592		844,493
රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන		42,000,000		34,500,000
මූල්‍ය කටයුතු වලින් උත්පාදනය වන / (භාවිතා කරන) ශුද්ධ මුදල් ප්‍රවාහය		42,930,592		35,344,493
මුදල් හා මුදල් සමාන දෑ වල වෙනස් වීම		26,274,380		(10,950,570)
මුදල් හා මුදල් සමාන දෑ ආරම්භක ශේෂය		16,588,375		27,538,945
මුදල් හා මුදල් සමාන දෑ අවසන් ශේෂය	**සටහන A**	42,862,755		16,588,375
		-		-

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 5 සිට 18 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාළ සටහන **සටහන A**

මුදල් හා මුදල් සමාන දෑ	**2021**		**2020**
	රු.		රු.
අතේ ඇති මුදල් / සුළු මුදල්	128,632		185,000
බැංකුවේ මුදල්	38,169,578		13,955,596
කෙටිකාලීන ආයෝජන - ණය අරමුදල	4,564,545		2,447,779
	42,862,755		16,588,375

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකා පදනම් ආයතනය 1973 අංක 31 දරණ ශ්‍රී ලංකා පදනම් නීතිය මගින් පාලනය වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. එය ආරම්භයේ සිට 2019 දෙසැම්බර් 09 දක්වා රාජ්‍ය නායකයා සහ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක විය. අංක 2153/12 අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ශ්‍රී ලංකා පදනම් ආයතනය 2019 දෙසැම්බර් 10 වන දින සිට බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද අතර පසුව එය 187/27 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් විය.

ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය අංක 100, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 හි පිහිටා ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

කළමනාකරණ මණ්ඩලයේ යෝජනාවකට අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 25 දින නිකුත් කිරීමට අවසර දී ඇත.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකා පදනම් ආයතනය එහි කාර්ය භාරය අනුව සේවක අධ්‍යාපන , ප්‍රජා සංවර්ධනය හා තරුණ කටයුතු පිළිබඳ විවිධ අධ්‍යාපන සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වයි. වැඩිහිටි සිසුන් සඳහා ගාස්තු අය කිරීම හෝ බාහිරව අරමුදල් සපයන වැඩසටහන් ලෙස සහතික පත්‍ර , ඩිප්ලෝමා සහ ආචාර්ය උපාධි වැඩසටහන් හඳුන්වා දෙමින් ශ්‍රී ලංකා පදනම් ආයතනය සිය අධ්‍යාපනික සේවා ලබාදීමේ කටයුතු පුළුල් කර තිබේ.

1.4 සේවක සංඛ්‍යාව

2021 වර්ෂය අවසාන වන විට සේවකයින් සංඛ්‍යාව 135 කි. (2020 වසරේදී - 144)

2. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය , මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය , ශුද්ධ වත්කම්වල වෙනස්වීම් ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

2.2 ගිණුම් සකස් කිරීමේ පදනම

අදාළ සටහන් මගින් පැහැදිලි කර ඇති සාධාරණ අගය සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් හැරුණු විට මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී මුදල් සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය පදනමේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වේ.

2.4 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීමේ පදනම

2.4.1 දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගයෙන් නැවත තක්සේරු කරන දින දක්වා අදාළ ක්ෂයවීම් අඩු කල පසු වටිනාකමට හඳුනාගැනේ. සින්නක්කර ඉඩම් පිරිවැය යටතේ සඳහන් වේ.

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය යනු එවැනි වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම වෙනුවෙන් දරන්නට සිදුවන අනුෂාංගික පිරිවැයයි.

2.4.2. කොළඹ 07 හි නිදහස් මාවතේ අංක 27 හි පිහිටි ශ්‍රී ලංකා පදනම් ආයතනයට අයත් දේපලක් එහි ප්‍රධාන කාර්යාල සංකීර්ණය ලෙස භාවිතා කරන ලදී. එය 2003 දී ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අත්පත් කර ගන්නා ලදී. අනතුරුව එය හිටපු ජනාධිපති නිල නිවස ලෙස පරිවර්තනය කරන ලදී. කෙසේ වෙතත් මෙම දේපල තවමත් ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් කිසිම පාර්ශවයකට නීත්‍යානුකූලව පැවරී නැති අතර ඒ සඳහා වන්දි ලබා දීමක්ද සිදුවී නොමැත.

2.4.3. ශ්‍රී ලංකා පදනම් ආයතනයට හිමි ශ්‍රී ලංකා රූපවාහිනී පුහුණු ආයතනයේ (ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ව්‍යාපෘතියක්) ඉඩම හා ගොඩනැඟිලි 2011 සිට 2018 දක්වා තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අත්පත් කර ගෙන ඇති අතර ඒ සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයට වන්දි ලබා දී නොමැත. කෙසේ වෙතත්, එම ඉඩම සහ ගොඩනැඟිල්ල අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් යටතේ 2018 සිට බලපැවැත්වෙන පරිදි නැවත ශ්‍රී ලංකා පදනම් ආයතනයට පවරා දී තිබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.4.4 ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙනි.

සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ සාධාරණ අගය සහ ක්ෂයවීම් මුදල ක්‍රමානුකූලව වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය තුළ සමාන වාරික වශයෙන් වෙන් කරනු ලැබේ. ක්ෂය අනුපාත පහත පරිදි වේ.

ගොඩනැගිලි වසරකට	5%
පිරියත සහ යන්ත්‍රෝපකරණ වසරකට	10%
කාර්යාලයීය ගෘහ භාණ්ඩ හා උපකරණ වසරකට	10%
තාක්ෂණික උපකරණ වසරකට	25%
පරිගණක වසරකට	20%
විදුලි උපකරණ වසරකට	10%
නඩත්තු උපකරණ වසරකට	10%
මුළුතැන්ගෙයි උපකරණ වසරකට	10%
රථ වාහන වසරකට	20%
ශාරීරික ව්‍යායාම උපකරණ වසරකට	20%
පුස්තකාල පොත් වසරකට	7.5%
ඉඩම වැඩිදියුණු කිරීම	5%

දේපල, පිරියත සහ උපකරණවල එක් එක් සැලකිය යුතු කොටස සඳහා ක්ෂය කිරීමේ ගාස්තු වෙන වෙනම තීරණය කරනු ලබන අතර එම වත්කම් භාවිතයට ගත හැකි විට ක්ෂය කිරීමට පටන් ගනී. සින්නක්කර ඉඩම් සඳහා ක්ෂය වෙන්කිරීම් සිදු කරනු නොලැබේ.

2.4.5 ගොඩනැගිලි සහ රථ වාහන 2018 දී නැවත තක්සේරු කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන වලට ඉන් ඇතිවන බලපෑම ගලපා ඇත.

මේ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයක් නිර්මාණය කරන ලද අතර එය ප්‍රාග්ධන සංචිතයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වේ. ප්‍රත්‍යාගණන සංචිතය එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා ක්‍රමානුකූල හා තාර්කික පදනමක් මත ආදායමක් ලෙස හඳුනාගැනේ.කෙසේ වෙතත්, ඉහත (2.4.2) හි විස්තර කර ඇති හේතුව නිසා අංක 27, නිදහස් මාවතේ, කොළඹ 7 හි ගොඩනැගිල්ල නැවත තක්සේරු කර නොමැත.

ශ්‍රී ලංකා පදනම් ආයතනය සිය සින්නක්කර ඉඩම් නැවත තක්සේරු කර නැත.

2.5 තොගය

බඩු තොග අමතර කොටස්, නඩත්තු භාණ්ඩ, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, ඉන්ධන සහ ලිපි ද්‍රව්‍ය වලින් සමන්විත වන අතර තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සඳහන් වේ.

'පෙර ලැබීම් පෙර නිකුතු' (FIFO) පදනම මත ආහාර හා පාන තොගය අගය කර ඇත.

2.6 ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ

ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කර ඇත්තේ අපේක්ෂිත උපලබ්ධි වටිනාකමෙන් බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම් අඩු කිරීමෙන් පසු ශුද්ධ අගයට ය.

2.7 මුදල් හා මුදල් වලට සමාන දෑ

ස්ථාවර තැන්පතු වල කෙටිකාලීන ආයෝජන, බැංකුවේ මුදල්, අතේ ඇති මුදල් සහ මුදල් අග්‍රිම වලින් මුදල් හා මුදල් වලට සමාන දෑ සමන්විත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ 'වක්‍ර ක්‍රමය' භාවිතා කරමිනි.

2.8 විලම්භීත ආදායම

2.8.1 විලම්භීත ආදායම ලෙස සැලකෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් හා ද්‍රව්‍යමය වශයෙන් ලැබුණු ප්‍රදානය.

2.8.2 දිගුකාලීන අරමුදල් සහිත ව්‍යාපෘති වලින් මුදල් හා ද්‍රව්‍ය ලෙස ලැබෙන ප්‍රදානයන් විලම්බිත ආදායම යටතේ පෙන්වනු ලැබේ.

විලම්භීත ආදායම ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වේ.

2.9 විශ්‍රාමික පාරිතෝෂිකය

පළමු වර්ෂයේ සිට ඇරඹෙන සෑම සේවා වර්ෂයක් සඳහාම සියළුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ මාස භාගයක වැටුප මත පදනම්ව ගණනය කරන ලද මුදලකට සමාන විශ්‍රාමික පාරිතෝෂික සඳහා මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ සේවකයෙකුට වගකීම පැවරෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

වත්මන් වර්ෂයට අදාළ සමස්ථ පාරිතෝෂික වගකීම් වටිනාකම ජංගම වගකීම් යටතේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දැක්වේ.

2.10 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ කරන දිනට දන්නා සියළුම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර පැවැත්ම නිශ්චිතව තහවුරු කළ හැකි නමුත් ප්‍රමාණය නිශ්චිතව නිර්ණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත.

ඉල්ලුමට අනුව හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්වය ප්‍රකාශය කළ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

2.11 රජයේ ප්‍රදානය

2.11.1 පුනරාවර්තන ප්‍රදාන

පදනමේ ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙන් රජයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදානය පෙන්වා ඇත.

2.11.2 ප්‍රාග්ධන ප්‍රදාන

රජයෙන් මුදල් හා ද්‍රව්‍ය වශයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදානය විලම්භීත ආදායමක් ලෙස සලකා ඇති අතර එය ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වටා ක්‍රමානුකූල හා තාර්කික පදනමක් මත ආදායමක් ලෙස හඳුනා ගැනේ. ජංගම නොවන වගකීම් යටතේ විලම්භීත ආදායම ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදානය දක්වා ඇත.

2.12 ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති බවත් එය විශ්වසනීයව මැනිය හැකි බවත් තහවුරු වූ විට ආදායම හඳුනාගෙන තිබේ.

පහසුකම් කුලියට ගැනීම, පාඨමාලා ගාස්තු සහ විලම්භීත ආදායම ක්‍රමක්ෂය කිරීම තුළින් ලැබෙන ආදායම මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශනයේ වෙනත් ආදායමක් ලෙස හඳුනා ගැනේ.

දිගුකාලීන පාඨමාලා ගාස්තු හැර අනෙක් ආදායම උපචිත පදනම මත ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. දිගු කාලීන පාඨමාලා ගාස්තු මුදල් පදනම මත ආදායමක් ලෙස හඳුනා ගැනේ.

වර්තමාන වගකීම් යටතේ, ලැබිය යුතු සම්මන්ත්‍රණ අත්තිකාරම් ලෙස අනාගත කාල පරිච්ඡේදයන්ට අදාළ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා ලැබෙන පාඨමාලා ගාස්තු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වේ.

2.13 වියදම්

පිරිවැය සහ නිශ්චිත ආදායම් භාණ්ඩ ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයක් පැවතීමේ පදනම මත මුල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් හඳුනා ගැනේ.

උපචිත පදනම මත මුල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය පිළියෙල කිරීමේදී වියදම් හඳුනා ගැනේ.

2.14 නීතිමය කරුණු

සේවකයින්ගේ කාරණා සම්බන්ධ නෛතික ගැටළු ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ කම්කරු විනිශ්චය සභාවේ වාර්තා කරන දිනට විභාග වෙමින් පවතී.

2.15 ණය අරමුදල

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සේවක සේවිකාවන්ගේ ආපදා ණය ලබා දීම සඳහා මීට වසර 32 කට පෙර රාජ්‍ය නොවන ආයතනවලින් ලැබුණු අතිරික්තයෙන් අරමුදල් මාරු කරමින් චක්‍රීය අරමුදලක් ලෙස වෙනම අරමුදලක් නිර්මාණය කර ඇත. මෙම අරමුදලේ ප්‍රධාන ආදායම වන්නේ සේවකයින්ගේ ආපදා ණය වලින් අය කරනු ලබන පොළියයි.

2.16 හිමිකම් වල සිදුවූ වෙනස් වීම

ශුද්ධ වත්කම්වල වෙනස්වීම් ප්‍රකාශය තුල දක්වා ඇති අයිතමයන් අතර අගයන් වල වර්ගීකරණ දෝෂයක් සිදුවී ඇත .ජාතික විගණක දෙපාර්තමේන්තුවේ උපදෙස් ඇතිව අදාළ ගැලපීම් ඉදිරි වර්ෂය තුල සිදු කිරීමට අපේක්ෂා කරමි.

2.17රූපවාහිනී නාලිකාව සහ වෙබ් ගුවන්විදුලිය

සීමා සහිත මායා හෝල්ඩින්ස්) පුද් (.සමාගම සමඟ සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගම සහ SLT Vision com (පුද්) සමාගම මගින් PEO TV නාලිකාවක් (නාලිකා අංක 121) ලෙස "Sanda TV" විකාශය කිරීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය ගිවිසුමක් අත්සන් කර තිබේ.

2.17 වෙනත් සංවිධාන සමඟ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම්

පස් අවුරුදු කාල සීමාවක් සඳහා උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය මැලේසියාවේ ලින්කන් විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් කර ඇත. 2021 වර්ෂය අවසානය වන විට ලින්කන් විශ්ව විද්‍යාලය සමග ආචාර්ය උපාධි - 3, පශ්චාත් උපාධි - 4, උපාධි - 4, ඩිප්ලෝමා - 4 ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

ලංකා බැංකුව සමඟ එක්වී ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පාඨමාලා හදාරන සිසුන්ට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමට අපේක්ෂා කරයි.

2.18 පරිසනකයක් අස්ථානගත වීම

වර්ෂය තුල ආයතනය තුල පැවති පරිසනකයක් අස්ථාන ගත වීම පිලිබඳ සිදුවීමක් වාර්තා විය . මෙම පරිගණකයට අදාළ වටිනාකම වග කිව යුතු නිලධාරීන්ගෙන් ය කර ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - **3**				
දේපළ, පිරියත සහ උපකරණ				
(අ) පිරිවැය	**2021.01.01** දිනට පිරිවැය	වර්ෂය තුළ එකතු කිරීම්	අඩු: බැහැර කිරීම්	**2021.12.31** දිනට ශේෂය
උපලේඛනය - **1**	රු.	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්	80,570,063	-	-	80,570,063
ඉඩම වැඩි දියුණු කිරීම		4,596,315	-	4,596,315
ගොඩනැගිලි	798,020,339	23,678,022	-	821,698,361
කාර්යාලයීය ගෘහ භාණ්ඩ සහ උපකරණ	44,923,439	4,861,680	156,386	49,628,733
තාක්ෂණික උපකරණ	31,736,815	72,792	-	31,809,607
පරිගණක	21,055,599	275,250	110,700	21,220,149
විදුලි උපකරණ	31,758,134	3,309,097	774,600	34,292,630
පිරියත සහ යන්ත්‍රෝපකරණ	7,562,014	166,500	-	7,728,514
නඩත්තු උපකරණ	2,117,238	-	-	2,117,238
මෝටර් වාහන	36,900,000	-	-	36,900,000
මුළුතැන්ගෙයි උපකරණ	10,044,068	1,201,805	-	11,245,873
ශාරීරික ව්‍යායාම උපකරණ	3,030,441	930,365	-	3,960,806
පුස්තකාල පොත්	4,377,948	56,765	-	4,434,712
පරිසනක මෘදුකාංග	-	290,000	-	290,000
එකතුව	1,072,096,097	39,438,590	1,041,686	1,110,493,003
(ආ) ක්ෂයවීම්	**2021.01.01** දිනට ශේෂය	වර්ෂය තුළ අය කිරීම්	අඩු: බැහැර කිරීම්	**2021.12.31** දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්				
ඉඩම වැඩි දියුණු කිරීම	-	245,111		245,111
ගොඩනැගිලි	114,022,154	37,266,249		151,288,403
කාර්යාලයීය ගෘහ භාණ්ඩ සහ උපකරණ	28,072,942	3,341,883	156,386	31,258,439
තාක්ෂණික උපකරණ	26,265,189	2,690,416		28,955,605
පරිගණක	15,291,385	2,628,812	81,180	17,839,017
විදුලි උපකරණ	15,804,616	2,991,064	774,600	18,021,080
පිරියත සහ යන්ත්‍රෝපකරණ	6,590,242	111,412		6,701,654
නඩත්තු උපකරණ	1,551,740	78,385		1,630,125
මෝටර් වාහන	17,220,000	7,380,000		24,600,000
මුළුතැන්ගෙයි උපකරණ	7,206,981	724,194		7,931,175
ශාරීරික ව්‍යායාම උපකරණ	344,926	661,541		1,006,467
පුස්තකාල පොත්	3,677,678	140,134		3,817,812
පරිසනක මෘදුකාංග		13,656		13,656
එකතුව	236,047,854	58,272,858	1,012,166	293,308,546
(ඇ) වත්කම්වල ශුද්ධ වටිනාකම		**31.12.2021** දිනට ශේෂය		**31.12.2020** දිනට ශේෂය
		රු.		රු.
සින්නක්කර ඉඩම්		80,570,063		80,570,063
ඉඩම වැඩි දියුණු කිරීම		4,351,204		-
ගොඩනැගිලි		670,409,958		683,998,185
කාර්යාලයීය ගෘහ භාණ්ඩ සහ උපකරණ		18,370,294		16,850,497
තාක්ෂණික උපකරණ		2,854,002		5,471,626
පරිගණක		3,381,132		5,764,214
විදුලි උපකරණ		16,271,550		15,953,517
පිරියත සහ යන්ත්‍රෝපකරණ		1,026,860		971,772
නඩත්තු උපකරණ		487,113		565,498
මෝටර් වාහන		12,300,000		19,680,000
මුළුතැන්ගෙයි උපකරණ		3,314,698		2,837,087
ශාරීරික ව්‍යායාම උපකරණ		2,954,339		2,685,515
පුස්තකාල පොත්		616,900		700,269
පරිසනක මෘදුකාංග		276,344		
එකතුව		817,184,457		836,048,244

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - 4		**2021**		**2020**
ප්‍රාග්ධන ස්වභාවයේ - නොනිමි වැඩ	**උපලේඛනය - 2**	රු.		රු.
වහලය සෑදීම		207,949		-
චිත්‍රාගාරය ඉදිකිරීමට සම්බන්ධ වාස්තු විද්‍යාත්මක සැලසුම් සටහන්		1,049,124		1,049,124
ආලින්ද ප්‍රදේශය අලුත්වැඩියා කිරීම		-		1,925,589
හෙළ බොජුන් අවන්හල - උපදේශන ගාස්තු		125,988		125,988
මූළුතැන්ගෙයි අලුත්වැඩියාව		26,846,286		24,829,003
යෝජිත ශ්‍රවණාගාරය - උපදේශන ගාස්තු		811,105		-
යෝජිත ශ්‍රවණාගාරය - දැන්වීම් ගාස්තු		35,640		-
		29,076,092		27,929,704
සටහන - 5				
භාණ්ඩ තොගය	**උපලේඛනය - 3**			
අමතර කොටස් සහ නඩත්තු අයිතම		553,688		616,709
පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය		276,540		485,645
ලිපි ද්‍රව්‍ය		1,028,566		1,278,867
ආහාර සහ පාන වර්ග		871,018		577,044
විදුලි ජනක යන්ත්‍රය සඳහා ඉන්ධන		215,202		303,815
		2,945,013		3,262,079
සටහන - 6				
ලැබිය යුතු ගිණුම්				
අත්තිකාරම්	**උපලේඛනය - 4**	204,896		1,100,016
ණය ගැතියන්	**උපලේඛනය - 5**	16,714,011		6,475,993
සේවක උත්සව ණය - ලංකා බැංකු ණය පහසුකම		-		2,810,000
ලැබිය යුතු වෙනත්	**උපලේඛනය - 6**	408,772		418,264
උත්සව අත්තිකාරම්		4,000		-
තැන්පතු	**උපලේඛනය - 7**	673,300		673,300
ලැබිය යුතු රඳවාගත් බදු		1,375,812		1,375,812
අවිනිශ්චිත ගිණුම	**උපලේඛනය - 8**	(1,061,862)		189,588
පරිසනකය සඳහා අය විය යුතු මුදල්	**උපලේඛනය - 9**	107,356		-
හිටපු සේවකයින්ගේ හිඟ මුදල්	**උපලේඛනය - 10**	1,533,233		1,241,339
		19,959,517		14,284,312
අඩු - බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම	**උපලේඛනය - 11**	7,696,863		6,844,605
		12,262,655		7,439,706
කාර්ය මණ්ඩල ආපදා ණය - ණය අරමුදල	**උපලේඛනය - 12**	18,324,700		19,198,111
		30,587,355		26,637,817

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
		2021		**2020**
සටහන - 7		රු.		රු.
පෙරගෙවුම්	**උපලේඛනය - 13**	131,692		72,679
සටහන - 8				
මුදල් සහ මුදල් සමාන දෑ				
ලංකා බැංකු - ණය අරමුදලේ කෙටිකාලීන තැන්පතු	**උපලේඛනය - 14**	4,564,545		2,447,779
බැංකුවල මුදල්				
ලංකා බැංකු ගිණුම් අංක 2323066 - ලැබීම් ගිණුම	**උපලේඛනය - 15**	43,106,192		13,123,131
ලංකා බැංකු ගිණුම් අංක 2323056 - ගෙවීම් ගිණුම	**උපලේඛනය - 16**	(5,765,147)		(537,384)
ලංකා බැංකු ගිණුම් අංක 2323195 - ණය අරමුදල	**උපලේඛනය - 17**	828,534		1,369,849
අතේ ඇති මුදල් / අග්‍රිම	**උපලේඛනය - 18**	128,632		185,000
		42,862,756		16,588,375
සටහන - 9				
විලම්භීත ආදායම				
රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	**උපලේඛනය - 19**	271,622,689		248,067,289
LRDC ව්‍යාපෘති ප්‍රදාන	**උපලේඛනය - 20**	-		2,904,890
අවිනිශ්චිත ගිණුම		-		51,920
		271,622,689		251,024,099
සටහන - 10				
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**උපලේඛනය - 21**			
ජනවාරි 01 වන විට ශේෂය		49,083,738		47,559,442
වර්ෂය සඳහා ප්‍රතිපාදන		4,967,174		8,717,006
		54,050,912		56,276,448
අඩු - වර්ෂය තුළ ගෙවීම්	8,207,308			7,192,710
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයේ වත්මන් කොටස-				
ජංගම වගකීම් වලට මාරු කලා	14,876,580	23,083,888		18,261,100
		23,083,888		25,453,810
		30,967,024		30,822,638

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - 11		**2021**		**2020**
		රු.		රු.
ගෙවිය යුතු ගිණුම්				
සම්මන්ත්‍රණ අත්තිකාරම් ලැබීම්	**උපලේඛනය - 22**	13,003,093		5,629,472
වෙනත් ණය හිමියන්	**උපලේඛනය - 23**	4,864,567		8,682,522
රඳවා ගැනීමේ මුදල්	**උපලේඛනය - 24**	3,662,835		2,972,770
ගෙවිය යුතු කාර්ය මණ්ඩල සේවා ගාස්තු		17,583,348		8,954,005
වත්මන් වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය	**උපලේඛනය - 25**	14,876,580		18,261,100
කාර්ය මණ්ඩලය සඳහා අතිරේක උත්සව බැංකු ණය පහසුකම		-		2,810,000
ගෙවිය යුතු මුද්දර ගාස්තු		26,900		16,975
ගෙවිය යුතු වෙනත් දෑ	**උපලේඛනය - 26**	2,168,972		1,219,436
ආරක්ෂක බැඳුම්කර	**උපලේඛනය - 27**	100,000		100,000
		56,286,295		48,646,280
සටහන - 12				
උපචිත වියදම්	**උපලේඛනය - 28**	21,013,970		19,959,740
සටහන - 13				
සමුච්චිත අරමුදල				
වර්ෂය ආරම්භයේදී ශේෂය		6,582,809		17,361,406
ණය අරමුදලෙන් මාරු කළ අරමුදල		-		-
		6,582,809		17,361,406
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		24,437,646		(10,778,597)
		31,020,455		6,582,809
වර්ෂය අවසානයේ ශේෂය		31,020,455		6,582,809
සටහන - 14				
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය				
ගොඩනැගිලි		634,708,923		634,708,923
මෝටර් වාහන		13,310,831		13,310,831
ප්‍රත්‍යාගණන සංචිතය		648,019,754		648,019,754
පෙර වසර අවසානය තෙක් සිදු කල ක්‍රමක්ෂය		117,560,000		
		530,459,754		
අඩු: 2021 වසර සඳහා ක්‍රමක්ෂය				
ගොඩනැගිලි	35,150,000			
මෝටර් වාහන	7,380,000			
		42,530,000		117,560,000
වර්ෂය අවසානයේ ශේෂය		487,929,754		530,459,754

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - 15		**2021**		**2020**
ණය අරමුදල		රු.		රු.
වර්ෂය ආරම්භයේදී ශේෂය		23,043,577		22,199,084
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	**උපලේඛනය - 29**	903,598		844,493
වර්ෂය අවසානයේ ශේෂය		23,947,175		23,043,577
සටහන - 16				
වෙනත් ආදායම්				
පහසුකම් කුලියට දීමෙන් සහ ආහාරපාන විකිණීමෙන් ලද ආදායම		47,289,860		39,792,366
පහසුකම් කුලියට දීමෙන් ලද ආදායම -SLTTI		504,545		-
පාඨමාලා ගාස්තු	**උපලේඛනය - 30**	51,778,413		42,845,924
පාඨමාලා ගාස්තු - ලින්කන් විශ්ව විද්‍යාල වැඩසටහන්	**උපලේඛනය - 31**	19,136,801		1,880,000
හවුල්කාරිත්ව ආදායම - ලින්කන් විශ්ව විද්‍යාල වැඩසටහන්		1,350,000		-
ඊ-ගේට් වැඩසටහන් ආදායම		4,048,682		1,113,636
රූපවාහිනී නාලිකා ආදායම	**උපලේඛනය - 32**	1,442,300		1,432,750
ඩිජිටල් පරිවර්තන ඒකකය ආදායම	**උපලේඛනය - 33**	-		4,510,661
කුලී ආදායම - SLTTI පරිශ්‍රය		383,155		165,435
කුලී ආදායම - Q Shop		420,000		-
විලම්භිත ආදායම ක්‍රමක්ෂය කිරීම		60,974,600		59,361,443
ක්‍රීඩා යෝග්‍යතා සංවර්ධනය මධ්‍යස්ථානයේ ආදායම		1,051,650		437,850
වෙබ් අඩවි නිර්මාණය කිරීම		602,942		-
යූටියුබ් වැනල් අදායම		823,176		-
මයික්‍රොසොෆ්ට් ව්‍යාපෘති අදායම		816,991		-
වෙබ් ගුවන්විදුලි ශුද්ධ අදායම		218,649		-
අනුග්‍රාහකත්ව ආදායම්		500,000		-
වෙනත් ආදායම්	**උපලේඛනය - 34**	4,469,598		2,182,167
		195,811,362		153,722,233
සටහන - 17				
පුද්ගල පඩි නඩි				
වැටුප් හා වේතන		69,918,218		71,684,315
සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය		12,548,643		12,853,853
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය		2,509,729		2,570,771
ජීවන වියදම් දීමනාව		12,401,593		12,561,203
වාහන දීමනාව		468,548		600,000
මාණ්ඩලික නිලධාරීන්ට වෘත්තීය දීමනා		1,335,806		1,444,833
අභ්‍යාසලාභීන්ගේ දීමනා		117,000		115,724
වැඩ බලන දීමනා		279,448		459,377
කාර්ය මණ්ඩල අතිකාල		5,169,342		5,369,734
නිවාඩු දින දීමනා		218,506		396,425
වාර්ෂික / වෛද්‍ය නිවාඩු ලබා ගැනීම		5,641,700		6,415,683
කාර්ය මණ්ඩල සුභසාධනය සහ පරිභෝජනය		42,529		132,812
කාර්ය මණ්ඩල අධ්‍යාපනය		35,000		132,000
කාර්ය මණ්ඩල නිල ඇඳුම්		-		982,613
පාරිතෝෂිකය		4,967,174		8,717,006
ඉන්ධන දීමනා		827,272		434,290
කාර්ය මණ්ඩල සෞඛ්‍ය දීමනාව		19,830		-
		116,500,338		124,870,638

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - 18		**2021**		**2020**
		රු.		රු.
භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන භාණ්ඩ				
මුළුතැන්ගෙය පරිභෝජනය		727,157		156,486
ගෑස්		327,677		142,213
පූවක්පත් සහ චාර සඟරා		32,930		51,050
ඇතිරිලි		335,525		118,100
කාර්යාලීය පරිභෝජනය		277,267		63,613
උපකරණ හා පහසුකම් කුලියට ගැනීම		755,110		841,075
වාහන සඳහා ඉන්ධන		967,813		777,636
විදුලි ජනන යන්ත්‍රය සඳහා ඉන්ධන		88,613		101,272
		3,512,092		2,251,444
සටහන - 19				
නඩත්තු				
ගොඩනැගිලි නඩත්තුව		1,213,475		2,217,609
උද්‍යාන නඩත්තුව		704,055		975,005
නේවාසිකාගාර නඩත්තුව		2,186,460		1,541,217
නඩත්තු පරිභෝජනය		993,921		929,353
ගෘහ භාණ්ඩ හා උපකරණ නඩත්තු කිරීම		2,809,290		2,025,469
මෝටර් වාහන අළුත්වැඩියා කිරීම		1,302,486		1,202,128
කාර්යාල නඩත්තුව		146,833		
		9,356,520		8,890,781
සටහන - 20				
ගිවිසුම් සේවා				
රක්ෂණය		2,487,858		2,496,702
විදුලි බිල්පත් ගාස්තු		9,941,701		9,901,240
ජල බිල්පත් ගාස්තු		676,747		823,171
ආරක්ෂක ගාස්තු		2,592,000		2,722,800
දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය		3,003,183		3,016,311
වාහන - බදු කුලිය		4,026,128		4,231,346
		22,727,616		23,191,570
සටහන - 21				
පුහුණුව සහ අධ්‍යාපනය				
සම්පත්දායකයින්ට ගෙවීම්		17,018,356		8,933,466
ක්‍රීඩා යෝග්‍යතා සංවර්ධනය මධ්‍යස්ථානය		2,178,253		244,158
සහභාගිවන්නන්ගේ ගමන් වියදම්		-		5,500
You Lead ව්‍යාපෘති වියදම්		-		660,000
ඊ-ගේට් වැඩසටහන් වියදම්		898,001		927,081
ඩිජිටල් පරිවර්තන ඒකක වියදම්		129,000		2,760,673
චිත්‍රපට පාසල් වියදම්		1,704,633		906,232
ලින්කන් විශ්ව විද්‍යාල වැඩසටහන් වියදම්		15,464,191		163,675
සම්මන්ත්‍රණ සාමාන්‍ය වියදම්	**උපලේඛනය - 35**	362,302		242,300
LMS ගාස්තු		55,000		-
		37,809,736		14,843,085

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
සටහන - 22		**2021**		**2020**
		රු.		රු.
වෙනත් මෙහෙයුම් වියදම්				
ආහාරපාන වියදම්		11,855,134		12,062,422
පාලක මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනාව		518,800		382,000
සභාපතිතුමාගේ දීමනා සහ ඉන්ධන දීමනාව		1,161,600		1,098,825
උපදේශක දීමනා		100,000		100,000
දැන්වීම් සහ පුවත්පත් දැන්වීම්		1,026,826		1,371,019
ප්‍රවාහනය		11,440		31,350
තැපැල්		163,440		156,555
කාර්යාල මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය		3,254,887		2,530,783
වීඩියෝ නිෂ්පාදන වියදම්		1,157,523		2,010,115
මයික්‍රොසොෆ්ට් ප්‍රධාන		601,190		
වෙබ් ගුවන් විදුලි වියදම්		-		7,124
වෙබ් අඩවි නිර්මාණය කිරීම වියදම්		473,933		-
දායකත්වය		104,180		127,150
නීති ගාස්තු		82,500		100,000
විගණන ගාස්තු		479,000		400,000
වෘත්තීය ගාස්තු		234,652		406,260
මුද්දර ගාස්තු		28,950		27,575
බොල් ණය		852,257		105,049
සැරසිලි වියදම්		94,350		-
විනාශ වූ තොග		47,146		-
සාමාන්‍ය වියදම්		22,146		32,122
		22,269,953		20,948,347
සටහන - 23				
මූල්‍ය පිරිවැය				
බැංකු ගාස්තු		312,044		108,011
		312,044		108,011
සටහන - 24				
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය				
විකුණුම් ආදායම		469,900		124,970
අඩු: ලියා අඩු කල අගය				
පිරිවැය	930,986			12,983,986
සමුච්චිත ක්ෂයවීම	(930,986)			(12,375,551)
				608,436
ලාභය / (පාඩු)		469,900		(483,466)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑම/සී/එස්එල්එන්/01/21/202 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ඔක්තෝබර් දින

සභාපති

ශ්‍රී ලංකා පදනම

ශ්‍රී ලංකා පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 01. ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ.
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. සිජ්එම්/ඩි/එස්එල්එස්/01/21/202 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 29 දින

සභාපති
ශ්‍රී ලංකා පදනම

ශ්‍රී ලංකා පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ණයගැතියන්ගෙන් ණය අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමකින් පසු ණයගැතියන්ගේ හානිපූර්ණ අගයක් හඳුනා ගැනීමට කටයුතු නොකර ණයගැතියන්ගෙන් වර්ෂ 05 කට වැඩි ණය ශේෂ සඳහා සියයට 100 ක අඩමාන ණය වෙන් කිරීමක් ද අනෙකුත් ණයගැනි ශේෂ සඳහා සියයට 50 ත් සියයට 7.5 ක් අතර අඩමාන ණය වෙන් කිරීමක් ද සිදුකර තිබුණි. මේ පරිදි සමාලෝචිත වර්ෂයේ අවසානයට සිදුකර තිබුණු මුළු අඩමාන ණය වෙන් කිරීම රු. 7,696,863 ක් විය.

(ආ) දැනටමත් භාවිතා කරමින් පවතින ආයතනයෙහි මුළුතැන්ගෙයහි නවීකරණය සඳහා වැයකර ඇති රු.26,846,285 ක මුදලින් මුළුතැන්ගෙයි උපකරණ හා අළුත්වැඩියා වියදම් අවශය පරිදි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා අයභාර වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කරණු වෙනුවට නොනිම් වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 9,563,246 ක පාඨමාලා ගාස්තු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම වෙනුවට හඳුනා නොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර පහසුකම් සැපයීමේ කුලී ආදායම රු. 1,251,450 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන අවිනිශ්චිත ගිණුමක රඳවාගෙන තිබුණි. එම නිසා වර්ෂයේ අතිරික්තය රු.10,814,696 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය පිළිවෙළින් රු. 31,020,455 ක් සහ රු. 487,929,754 ක් ලෙස දක්වා තිබුණ ද, ශුද්ධ වත්කම් වෙනස් වීම් ප්‍රකාශයෙහි ඉහත අගයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව වෙනමම පෙන්නුම් කිරීමට කටයුතු නොකර එම අගයන් දායක ප්‍රාග්ධනය රු.595,168,179 ක් ලෙසද සමුච්චිත ඌනතාවය රු. 76,249,060 ක් ලෙස ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අගයන්ට අනුරූප නොවන පරිදි දක්වා තිබුණි.

1.3 ශ්‍රී ලංකා පදනමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ශ්‍රී ලංකා පදනමේ 2021 කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව , මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් , එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී , ශ්‍රී ලංකා පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ශ්‍රී ලංකා පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් කරුණු වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම් පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ , පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස , කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව නොමැති බව

3. වෙනත් කරුණු

(i). ශ්‍රී ලංකා පදනමට නීත්‍යානුකූල අයිතිය ඇති පොත් අගය රු. 5,283,015 ක් වූ ගොඩනැගිල්ලක් ලිඛිත ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයන්ට භාවිතය සඳහා ලබා දී තිබුණි.

(ii). ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා , ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 130 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි. ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරු 11 ක් සඳහා වාර්ෂික පාරිශ්‍රමිකය ලෙස රු.15,633,473 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු. 17,078,356 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 94 කින් 67 ක් සඳහා සම්පූර්ණයෙන් බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 27 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතිය ද පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති